දිස්ත්‍රික් ලේකම්ගෙන් . . . . . . . . .

ශ්‍රී ලංකා ජනරජය අපේක්ෂිත පරිදි ජනතා සේවාවන් සැපයීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට පැවරෙන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට අදාල වර්ෂය තුල උත්සාහ ගනු ලැබීය. දේශපාලන අධිකාරිය, මහජනතාව හා රාජ්‍ය ආයතන සමග ඍජු සබදතාවයකින් යුතුව කටයුතු කර උපරිම සේවාවක් සැලසීම පිණිස ක්‍රියාකර ඇත.

ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රතිපාදන මත ගම්පහ දිස්ත්‍රික්කයේ දිවිනැගුම ජාතික වැඩසටහන, ගම්පහ නගර සංවර්ධන වැඩසටහන, මාතෘ හා ළමා සායන වැඩිදියුණු කිරීමේ වැඩසටහන, සතිපොළ සංවර්ධන වැඩසටහන, ව්‍යායාම සදහා ඇවිදීමේ මංතීරු සකස් කිරීම, ප්‍රාථමික පාසැල් 5000 ක් හා ද්විතීක පාසල් 1000 ක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන වැනි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන යටතේ රු. මි. 23139 ක් වැයකර ව්‍යාපෘති 13959 ක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී අනිකුත් දෙපාර්තමේන්තු සහ ආයතන වලින් ලැබුනු සහාය විශේෂයෙන් සිහිපත් කරමි. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභාව වෙතින් ලැබුණු ප්‍රතිපාදන සියල්ලමද ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගන්නා ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, සැලසුම් කමිටුව, කෘෂිකර්ම කමිටුව, නිවාස කමිටුව හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් මගින් විධිමත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමට හැකි විය. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම, සංවර්ධන කටයුතු කඩිනම් සහ ක්‍රමවත් කිරීමට බෙහෙවින් ඉවහල් විය.

ගම්පහ දිස්ත්‍රික්කය තුල රාජ්‍ය සේවාවන් උපරිමව ජනතාවට සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස මහජන විරෝධතා සහ පැමිණිලි අවම මට්ටමක තිබීමද සතුටට කරුණකි.

මධ්‍යගත බඳවා ගැනීමේ ක්‍රමවේද නිසා ග්‍රාම නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් කෙටි කලක් තුල පුරප්පාඩු සඳහා පත්කර ගත නොහැකිය. එහෙත් සේවක පුරප්පාඩු තුල වුවද, වර්ෂය තුල ජනතා සේවය පිණිස කැපවුණු ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළුව කාර්යය මණ්ඩලයටද, පළාත් සභා සහ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නිලධාරීන්ටද මෙම ප්‍රගතිය ලබා දීමට දැක්වූ කැපවීම වෙනුවෙන් ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි.

මෙම වාර්තාව සකස් කිරීමට සහ පරිවර්තනය කිරීමට දායක වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ අනෙකුත් සියළු කාර්ය මණ්ඩල වල සේවය ද අගයකරනු කැමැත්තෙමි. ශ්‍රී ලංකාවේ වාසය කිරීමට සුදුසුම දිස්ත්‍රික්කය බවට ගම්පහ පත්කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට ඔබ සැමගේ කැපවීම සහ සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමි.

ජේ. ජේ. රත්නසිරි
ගම්පහ දිස්ත්‍රික් ලේකම්/දිසාපති හා
ස්වදේශ කටයුතු අතිරේක ලේකම්

| පටුන | පිටුව |
| --- | --- |


01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 1 - 14

1 . 1. දැක්ම, මෙහෙවර, කාර්යභාරය 1

1 . 2. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් විශාලත්වය, ග්‍රාම නිලධාරි වසම්, ගම් සංඛ්‍යාව, ජනගහනය සහ නිවාස ඒකක සංඛ්‍යාව 2

1 . 3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය හා 2012. 12.. 31 දිනට තත්වය 3

1 . 4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් 4

1 . 5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් කාර්ය මණ්ඩලය 5

1 . 6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලන අංශයෙන් ඉටුකරනු ලබන කාර්යයන් 6

1 . 7. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉටුකරනු ලබන කාර්යයන් 6

1 . 8. මානව සම්පත් සංවර්ධනය/ පුහුණු වැඩසටහන් 7

1 . 9. ණය සම්බන්ධ කටයුතු / කාර්ය මණ්ඩල සඳහා ණය නිකුත් කිරීම 8

1 . 10. පෞද්ගලික ආරක්ෂක ආයතන සහ ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම 8

1 . 11.. ගිනි අවි බලපත්‍ර 8-9

1 . 12. විස්තීරණ ආපදා වැඩසටහන, නිවාස හානි 9

1 . 13. සමාජසේවා කටයුතු 10-11

1 . 14. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා වැඩසටහන් 11-12

1 . 15. වෘත්තිය මාර්ගෝපදේශ වැඩසටහන් 12

1 . 16. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් 13

1 . 17. ක්‍රීඩා කටයුතු 14

02. පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අංශය 14-17

03. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය 18 - 28

3 . 1. විමධ්‍යගත මූලධන අයවැය ක්‍රියාත්මක වැඩසටහන - 2012 18

3 . 2. ගම්පහ දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන - 2012 18 - 20

3 . 3. ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව 20 - 21

3 . 4. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන විශේෂ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම 21

3 . 5. දිවි නැගුම වැඩසටහන - 2012 21 - 23

3 . 6. පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන 23

3 . 7. ගම්පහ නගර සංවර්ධන වැඩසටහන 23

3 . 8. මාතෘ හා ළමා සායන වැඩිදියුණු කිරීමේ වැඩසටහන 23 - 24

3 . 9. සතිපොළ සංවර්ධන වැඩසටහන - 2012 24

3 . 10. ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු සකස්කිරීම 24 - 25

3 . 11. දත්ත තොරතුරු හා මෙහෙයුම් මැදිරිය 25

3 . 12. ප්‍රාථමික පාසැල් 5000 ක් හා ද්විතීක පාසැල් 1000 ක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 25 - 26

3 . 13. එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන - 2012 27 - 28

04. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය 29 - 36

4 . 1. දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වූ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන 30

4 . 2. සමාජ සංවර්ධන වැඩසටහන 30

4 . 3. සමෘද්ධි බැංකු වැඩසටහන 31

05. සංස්කෘතික අංශය 37 - 39

06. බෞද්ධ කටයුතු අංශය 39 - 42

07. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය 42 - 44

08. සංඛ්‍යා ලේඛන අංශය 45

09. පාරිභෝගික කටයුතු පිලිබඳ අධිකාරිය 46

10. මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව 46

11. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය 47 - 49

12. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය 49 - 50

13. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය 51 - 52

14. කෘෂිකර්මය 53 - 55

14 . 1. නියෝජ්‍ය පලාත් කෘෂිකර්ම අධයක්ෂ ( ව්‍යාප්ති ) කාර්යාලය 53 - 54

14 . 2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 55

15. ඉඩම් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය 56 - 57

16. ගිණුම්

# 01. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1 . 1. දැක්ම, මෙහෙවර, කාර්යභාරය

**දැක්ම**

රාජ්‍ය සේවාලාභී සත්කාරයේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

රාජ්‍ය ප්‍රතිපත්තී වලට අනුකූලව ඵලදායී සම්පත් කළමනාකරණයක් තුලින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර ගම්පහ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවීම.

**කාර්යභාරය**

රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුකූල වෙමින් මනා කළමණාකාරීත්වය තුලින් ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ අපේක්ෂාවන් මල් ඵල ගන්වමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් ගොඩනැංවීම.

## 1 . 2 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, විශාලත්වය, ග්‍රාම නිලධාරි වසම්, ගම් සංඛ්‍යාව හා ජනගහනය.




| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විශාලත්වය ව. කිමී | ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | ජනගහනය 2001 | ජනගහනය 2012 | නිවාස ඒකක සංඛ්‍යාව 2012 |
|---|---|---|---|---|---|---|
| අත්තනගල්ල | 154.0 | 151 | 191 | 154,967 | 178,816 | 44,869 |
| බියගම | 61.6 | 49 | 61 | 161,300 | 186,862 | 47,636 |
| දොම්පෙ | 178.3 | 133 | 176 | 130,021 | 153,137 | 39,175 |
| දිවුලපිටිය | 202.3 | 123 | 227 | 128,048 | 143,871 | 38,580 |
| ගම්පහ | 95.7 | 101 | 148 | 171,040 | 196,445 | 50,723 |
| ජා ඇල | 64 | 57 | 101 | 184,666 | 201,154 | 51,736 |
| කටාන | 107.6 | 79 | 131 | 222,683 | 233,854 | 69,375 |
| කැලණිය | 21.9 | 37 | 47 | 134,364 | 134,693 | 32,584 |
| මහර | 98.8 | 92 | 108 | 176,870 | 207,230 | 52,191 |
| මිණුවන්ගොඩ | 130.5 | 121 | 192 | 151,661 | 178,401 | 46,396 |
| මීරිගම | 186.6 | 149 | 273 | 143,663 | 164,166 | 42,462 |
| මීගමුව | 30.8 | 39 | 50 | 144,274 | 141,676 | 34,040 |
| වත්තල | 54.6 | 46 | 105 | 160,127 | 174,336 | 42,297 |
| එකතුව | **1386.7** | **1177** | **1810** | **2,063,684** | **2,294,641** | **592,064** |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය.

## 1 . 3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය හා 2012.12.31 දිනට තත්වය

| තනතුර | ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප. සේ ) | විශේෂ ශ්‍රේණිය | 01 | 01 | --- |
| අතිරේක දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප.සේ ) | විශේෂ ශ්‍රේණිය | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) | I | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | | 01 | - | 01 |
| ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) | II/I | 01 | - | 01 |
| සහකාර දිස්ත්‍රික් ලේකම් (ශ්‍රී. ලං. ප. සේ ) | III | 01 | 01 | - |
| ඉංජිනේරු ( ශ්‍රී. ලං. ඉ. සේ. ) | II/II | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි (රා.ක.ස.සේ.) | අධි | 01 | 01 | - |
| අයවැය සහකාර | | 02 | 02 | - |
| සංවර්ධන සම්බන්ධීකාරක | | 02 | 02 | - |
| භාෂා පරිවර්තක | I | 01 | 01 | - |
| රාජ්‍ය කළමණාකරන සහකාර සේවය | I /11/ 111 | 25 | 17 | 08 |
| කාර්මික නිලධාරි | | 01 | 01 | - |
| සැලසුම් ශිල්පි | | 01 | 01 | - |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | III | 02 | 02 | - |
| පිළිගැනීමේ නිලධාරි | | 01 | - | 01 |
| රියදුරු | I/II | 05 | 07 | - |
| කාර්යාල සේවක සේවය | I/II/III | 10 | 09 | 01 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1 . 4. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක | 01 |
| කෘෂිකර්ම අධ්‍යක්ෂක | 01 |
| සහකාර අධ්‍යක්ෂක (පොහොර) | 01 |
| බෞද්ධ කටයුතු සමායෝජක | 02 |
| මානව සම්පත් සංවර්ධන සහකාර | 08 |
| ආපදා කළමනාකරණ සහකාර | 01 |
| භාෂා පරිවර්තක | 03 |

| | |
|---|---|
| සමත පුහුණු නිලධාරි | 01 |
| විශ්‍රාම වැටුප් නිලධාරි | 01 |
| සංස්කෘතික සංවර්ධන සහකාර | 03 |
| නැටුම් ශිල්පිනී | 01 |
| පුවත්පත් නිලධාරි | 01 |
| සමාජසේවා නිලධාරි | 01 |
| බලාත්මක නිලධාරි | 01 |
| ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර | 01 |
| විද්‍යා හා තාක්ෂණ නිලධාරි | 02 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි | 01 |
| සහකාර දිස්ත්‍රික් මනෝ සම්බන්ධීකාරක | 01 |
| වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරි | 03 |
| උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | 26 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

# 1.5 ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සේවක සංඛ්‍යා තොරතුරු -2012.12.31 ට

| අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රාදේශීය ලේකම් | සහකාර ප්‍රාදේශීය ලේකම් | ගණකාධිකාරී | පරිපාලන නිලධාරී (අධිපතිත්‍ය) | පරිපාලන ග්‍රාම නිලධාරී | රාජ්‍ය කළමණාකරණ සහකාර | | | තාක්ෂණ නිලධාරී | දත්ත ක්‍රියාකරු | රියදුරු | කාර්යාල කාර්ය සහායක | සනීපාරක්ෂක කම්කරුවන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | අනුමත | දැනට සිටින | පුරප්පාඩු | | | | | |
| 1 | අත්තනගල්ල | 1 | 1 | 1 | 1 | 1 වැ.බ | 36 | 36 | 0 | 1 | * 1 | 2 | 5 | 1 |
| 2 | බියගම | 0 | 1 | 1 | 1 | 1 | 25 | 25 | 0 | 1 | 1 | 2 | 6 | 1 |
| 3 | දිවුලපිටිය | 1 | 1 | 1 | 0 | 1 | 37 | 33 | 4 | 1 | 1 | 2 | 6 | 1 |
| 4 | දොම්පෙ* | 1 | 1 | 1 | 1 | 1 | 32 | 32 | 0 | 1 | 1 | 2 | 6 | 1 |
| 5 | ගම්පහ | 1 | 1 | 1 | 1 | 1 | 44 | 44 | 0 | 1 | 1 | 2 | 5 | 1 |
| 6 | ජාඇල | 1 | 1 | 1 | 1 | 1 | 33 | 29 | 4 | 1 | 1 | 2 | 4 | 1 |
| 7 | කටාන | 1 | 1 | 0 | 0 | 1 | 31 | 31 | - | 1 | 1 | 2 | 6 | 1 |
| 8 | කැලණිය | 1 | 1 | 1 | 1 | 1 | 29 | 27 | 2 | 1 | 1 | 2 | 6 | 1 |
| 9 | මහර | 1 | 1 | 1 | 1 | 0 | 31 | 27 | 4 | 1 | 1 | 2 | 5 | 1 |
| 10 | මිනුවන්ගොඩ | 1 | 1 | 1 | 1 | 1 | 34 | 30 | 4 | 1 | 1 | 2 | 4 | 1 |
| 11 | මීරිගම | 1 | 1 | 1 | 1 | 1 | 33 | 31 | 2 | 1 | 1 | 2 | 8 | 1 |
| 12 | මීගමුව | 1 | 1 | 1 | 1 | 0 | 30 | 22 | 8 | 1 | 1 | 2 | 5 | 1 |
| 13 | වත්තල | 1 | 1 | 1 වැ.බ. | 1 වැ.බ. | 1 වැ.බ. | 26 | 22 | 4 | 1 | 1 | 2 | 3 | 0 |
| | **එකතුව** | **12** | **13** | **12** | **11** | **11** | **421** | **389** | **32** | **13** | **13** | **26** | **69** | **12** |

* තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර * සනීපාරක්ෂක කම්කරු - පෞද්ගලික සේවයක් සපයා ඇත.

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1 . 6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලන අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

01. කාර්යාලයේ සහ කාර්යමණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාලව පාලන කටයුතු මෙහෙයවීම.

02. කෘෂිකර්ම කමිටුව, පාරිසරික නීති ක්‍රියාත්මක කිරීමේ ආරක්ෂිත කමිටුව, ධීවර කමිටුව, අබිං කමිටුව, නිවාස කමිටුව වැනි රැස්වීම් පැවැත්වීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණ කටයුතු.

03. විවිධ රාජ්‍ය සහ ආගමික උත්සව පැවැත්වීම.

04. කාර්ය මණ්ඩල පුහුණුව.

05. මහජනයාගෙන් කෙලින්ම ලැබෙන පැමිණිලි, පෙත්සම්, දුක්ගැනවිලි ආදිය පිළිබඳව පරීක්ෂාකිරීම සහ අදාල අංශවලට යොමුකිරීම.

06. තුවක්කු ආඥා පනත යටතේ ගිනි අවි බලපත්‍ර ඉල්ලීම් පිලිබඳ කටයුතු, වාර්ෂිකව ගිනි අවි බලපත්‍ර අළුත් කිරීම.

07. අන්තරායාකාරී ඖෂධ පාලන පනත යටතේ කටයුතු කිරීම.

08. පුපුරණ ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ලබාදීම සහ ආරක්ෂක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම.

## 1 . 7. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයන්

01. වාර්ෂික ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම.

02. දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම, බෙදාහැරීම සහ එම කාර්යාලවල මූල්‍ය කටයුතු මෙහෙයවීම.

03. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාසික ගිණුම් ප්‍රකාශ ලබාගෙන ඒකාබද්ධ වාර්තාවක් ලෙස භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම.

04. රේඛීය අමාත්‍යංශවලට ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

05. වාර්ෂික විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම පිළියෙල කිරීම.

06. ආදායම් එකතු කිරීම.

දිස්ත්‍රික්කයේ පරිපාලන හා සම්බන්ධීකරණ ප්‍රධාන ආයතනය ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කරයි. මහජනතාව හා රාජ්‍ය ආයතන සමග ඍජු සබදතාවයකින් යුතුව කටයුතු කර උපරිම සේවාවක් සැලසීම පිණිස ක්‍රියාකර ඇත

## 1 . 8. මානව සම්පත් සංවර්ධනය / පුහුණු වැඩසටහන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිළධාරීන් සඳහා පහත දැක්වෙන පුහුණු වැඩසටහන් පවත්වන ලදී

| පාඨමාලාව | පුහුණු මධ්‍යස්ථානය | සහභාගී වූ ගණන | තනතුර | පුහුණු දින ගණන | වියදම (රු) |
|---|---|---|---|---|---|
| යහපාලනය හා මානව සම්පත් කළමණාකරණය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 32 | රාජ්‍ය කළමණාකරණ සහකාර හා උපාධිධාරීන් | 05 | 42,890.00 |
| රියදුරු කාර්යසාධන පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 24 | රියදුරු මහතුන් | 02 | 18,590.00 |
| ඵලදායිතාවය සහ රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය වර්ධනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 38 | රාජ්‍ය කළමණාකරණ සහකාර හා උපාධිධාරීන් | 01 | 10,400.00 |
| විශ්‍රාම වැටුප් පුහුණුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 35 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 03 | 21,195.00 |
| උසස් පරිගණක පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 01 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 05 | - |
| සේවාරම්භක පුහුණුව | එම | 24 | එම | 10 | - |
| ආකල්ප වර්ධනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 200 | කාර්ය මණ්ඩලය | 01 | 60,210.00 |
| ව්‍යාපෘති කළමණාකරණය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 01 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 01 | - |
| විනය කාර්ය පරිපාටිය | එම | 01 | එම | 03 | - |
| කාර්යාල කළමණාකරනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 44 | එම | 05 | 48,440.00 |
| විදුලි පද්ධති පිළිබඳ පුහුණුව | එම | 24 | තාක්ෂණ නිලධාරීන් හා සැලසුම් ශිල්පීන් | 1/2 | 2,600.00 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

| පාඨමාලාව | සහභාගී වූ ගණන | අනුග්‍රහය | තනතුර | වියදම (රු) |
|---|---|---|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය | මාණ්ඩලික නිලධාරීන් | 60,000.00 |
| මූලික පරිගණක පුහුණුව | 112 | රාජ්‍ය කළමණාකරණ හා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය | රාජ්‍ය කළමණාකරණ සහකාර, උපාධිධාරීන් හා ග්‍රාම නිලධාරීන් | 241,547.00 |
| රාජ්‍ය ගිණුම් හා මූල්‍යය | 04 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | මාණ්ඩලික නිලධාරීන් | 30,000.00 |
| 3D Models & Home Building | 01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | සැලසුම් ශිල්පි | 18,000.00 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1 . 9. ණය සම්බන්ධ කටයුතු / කාර්ය මණ්ඩල සඳහා ණය නිකුත් කිරීම

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා නිකුත්කල ණය**

| ණය වර්ගය | සංඛ්‍යාව | වටිනාකම (රුපියල්) |
|---|---|---|
| ආපදා ණය | 24 | 981,611.00 |
| පාපැදි ණය | - | - |
| ණයබරින් මිදීමේ ණය | - | - |
| දේපල ණය | - | - |
| එකතුව | 24 | 981,611 .00 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1 . 10. පෞද්ගලික ආරක්ෂක ආයතන සහ ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම

පෞද්ගලික ආරක්ෂක ආයතන හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ කිහිපයක ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන / ස්වේච්ඡා සංවිධාන පහත පරිදි ලියාපදිංචි කරන ලදී.

| ලියාපදිංචි කල ආයතන වර්ගය | වර්ෂය තුල තිබූ ගණන | වර්ෂය තුල ලියාපදිංචි කිරීම් | වර්ෂය අග එකතුව |
|---|---|---|---|
| පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන | 126 | 11 | 137 |
| ස්වේච්ඡා සේවා සංවිධාන | 33 | 07 | 40 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### 1 . 11. ගිනි අවි බලපත්‍ර

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙම අංශය මඟින් ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීම, කෘෂිකාර්මික කටයුතු සඳහා ගිනිඅවි බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා එම අයදුම් පත්‍ර සඳහා දිස්ත්‍රික් ලේකම් නිර්දේශ ලබා දීම, නැවත රජයට භාර දෙන ගිනිඅවි භාර ගැනීමත් එම ගිනි අවි තක්සේරු කර විකිණීම හා මුරකරු බලපත්‍ර නිකුත් කිරීමත් සිදු කරණු ලැබේ. තවද ගිනිඅවි බලපත්‍ර පැවරීම සඳහා අයදුම් පත්‍ර නිකුත් කිරීම හා අධිකාරිත්වය වෙනස් කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබා දීමත් සිදුකරනු ලැබේ.

**<u>ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ගිනිඅවි පිළිබඳ තොරතුරු සාරාංශය - 2012</u>**

| | තනි කාණුවේ පතොරොම් තුවක්කු | පිස්තෝල | රිවෝල්වර් | රයිෆල් | රිපීටර් |
|---|---|---|---|---|---|
| කෘෂි කාර්මික කටයුතු | 1736 | - | - | 19 | - |
| කෘෂි කාර්මික නොවන කටයුතු | 275 | 95 | 32 | 10 | 5 |
| බැංකු ආරක්ෂක කටයුතු | 127 | 23 | 44 | 3 | 125 |
| රාජ්‍ය ආයතන ආරක්ෂක කටයුතු | 152 | 1 | 3 | - | - |
| පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන සතු | 29 | - | - | 8 | 3 |
| දිස්ත්‍රික්කයේ ඇති මුළු ගිනිඅවි ගණන | 2319 | 119 | 79 | 40 | 133 |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ගිනිඅවි බලපත්‍ර අළුත් කිරීමෙන් ලද ආදායම - රු. 686,340.00
ගිනිඅවි විකිණීම - රු. 125,500.00
නව ගිනිඅවි බලපත්‍ර සඳහා අයදුම් පත්‍ර ලබා දීම - රු. 1,000.00
මුරකරු බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම - රු. 2,780.00

## <u>1. 12. විස්තීරණ ආපදා වැඩසටහන , නිවාස හානි</u>

2012 මුදල් වර්ෂය තුල විස්තීරණ ආපදා වැඩසටහන, නිවාස හානි සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන සඳහා පහත පරිදි ප්‍රතිපාදන වැයකර ඇත.

| **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය** | **විස්තීරණ ආපදා ( ගංවතුර හා සුළි සුළං ) රු:** | **නිවාස හානි** |
|---|---|---|
| ගම්පහ | 245,570.90 | - |
| දිවුලපිටිය | 15,000.00 | |
| කටාන | 339,426.00 | 284,000.00 |
| මීගමුව | 58,500.00 | - |
| මිනුවන්ගොඩ | 35,580.00 | - |
| මීරිගම | 14,645.00 | 600,500.00 |
| අත්තනගල්ල | 163,928.00 | 576,500.00 |
| ජා - ඇල | 259,655.00 | 56,000.00 |
| වත්තල | 1,417,825.00 | - |
| මහර | 123,250.00 | - |
| දොම්පෙ | 80,650.00 | 226,000.00 |
| කැළණිය | 3,357,382.00 | 422,000.00 |
| බියගම | 3,113,135.00 | - |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | - |
| එකතුව | **9,224,547.40** | **2,165,000.00** |

මූලාශ්‍රය : පාලන අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 1.13. **සමාජසේවා කටයුතු**

මේ යටතේ සමාජ සුබ සාධන අමාත්‍යංශය විසින් මෙම කාර්යාලය සඳහා පත්කර ඇති නිලධාරීන් විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

1. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සේවා.
   1.1 මාසික ආදායම රු.6000.00ට වඩා අඩු, තමන්ගේ ම ඉඩමක් සහිත අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා ක්‍රියාත්මක කරනුලබන නිවාස ආධාර වැඩසටහන.(ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කෙරේ).
   මේ අනුව මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල නිවාස 69 ක් සඳහා රු. 11,253,000.00 ක මුදලක් නිවාස ආධාර ලබා දීම සඳහා වෙන් කරන ලදී.

   1.2 ස්වයං රැකියා ආධාර.

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා උපරිමය රු.25000.00කට යටත්ව ස්වයංරැකියා ආධාර ලබාදීම සිදුකෙරේ. ජා -ඇල, බියගම, අත්තනගල්ල, මීරිගම, ගම්පහ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුද්ගලයන් 5 දෙනෙකු සඳහා රු. 155,000/- ක ස්වයං රැකියා ආධාර මුදලක් ලබා දී ඇත.

   1.3 ඇස්කන්නාඩි ලබාදීමේ වෛද්‍ය සායන පැවැත්වීම.
   මිණුවන්ගොඩ, ජා ඇල, දොම්පේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඇස් කණ්නාඩි ලබාදීමේ වෛද්‍ය සායන 04 ක් පවත්වන ලදී.
   1.4 ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන වැඩසටහන 2012

ආබාධ සහිත පුද්ගලයන් ප්‍රජාවේ තබා අවශ්‍යතා සොයාබලමින් සවිබලගැන්වීම, ජීවනෝපාය සංවර්ධනය ,අන්තර්කරණය සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකරන මෙම වැඩසටහන සඳහා මෙම වර්ෂයේ රු. 120,000.00 වෙන් කර දෙන ලදී.

   1.5 මහින්ද චින්තන වැඩසටහන යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.3000.00 මාසික ජීවනආධාර ලබාදීම.
   මේ යටතේ මෙම දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 442 ක් සඳහා රු. 15912000.00 ක මුදලක් වෙන් කර දෙන ලදී.

2. තනි මාපිය පවුල් පුනරුත්ථාපන වැඩසටහන

පාසල් යන දරුවන් සහිත අඩු ආදායම්ලාභී වැන්දඹු කාන්තා/පිරිමි අය සඳහා ක්‍රියාත්මක මෙම ස්වයං රැකියා වැඩසටහන සඳහා මහර, දිවුලපිටිය, මිණුවන්ගොඩ, ජා ඇල, බියගම, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා රු.120,000.00 මුදලක් ලබාදෙන ලදී.

3. ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්.

   3.1 ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් වැඩිහිටි සංවිධාන පිහිටුවීම
   වයස අවු 60 ට වැඩි පුද්ගලයන් සාමාජිකත්වය ලබන මෙම සංවිධාන මගින් වැඩිහිටියන්ගේ සමාජ, ආර්ථික, ආගමික සහජීවනය ඇතිකරමින් ඔවුන්ගේ සුභසාධනය සඳහා වන ස්ව උපකාරක කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක වේ. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් පිහිටුවන ග්‍රාමීය වැඩිහිටි සංවිධාන වල නියෝජනයෙන් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා ඇති අතර එම බලමණ්ඩල නියෝජිතයන්ගෙන් සමන්විතව දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවා ඇත. 2012 වර්ෂයේදී දිස්ත්‍රික්කය තුල වෙසෙන කුසලතා පූර්ණ වැඩිහිටි පුද්ගලයන් ඒකරාශීකර අවුරුදු උත්සවයක්, ක්‍රීඩා තරගයක්, කලා ප්‍රසංගයක් සහ නිර්මාණ ප්‍රදර්ශනයක් පවත්වන ලද අතර අරමුදලක් ඇතිකර ගැනීම පිණිස ලොතරැයියක් පවත්වන ලදී. මෙම දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති වැඩිහිටි සංවිධාන සංඛ්‍යාව 897 කි.

   3.2 ගම්පහ දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය මගින් දිවිනැගුම වැඩසටහනට සමගාමීව පවත්ව ලද ගෙවතුවගා වැඩසටහන යටතේ එළවළු බීජ පැකට් බෙදාහරින ලදී. මේ යටතේ හොඳම ගෙවත්ත තෝරා ත්‍යාග ප්‍රදානය කරන ලදී.
   3.3 වයස අවු.60 ඉක්මවූ (2012.01.01 දිනට) මහජන ආධාර/සමෘද්ධි සහනාධාර ලාභී තනි පුද්ගලයන් සඳහා එම සහනාධාරය වෙනුවට මාසිකව රු.1000.00 ක දීමනාවක් පුද්ගලයන් 17035 කට ලබාදෙන ලදී.

| ආබාධිත පුද්ගල දීමනා - 2012 | |
|---|---|
| | |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වියදම(රුපියල්) |
| ගම්පහ | 1,224,000.00 |
| දිවුලපිටිය | 1,221,000.00 |
| කටාන | 1,224,000.00 |
| මීගමුව | 1,209,000.00 |
| මිනුවන්ගොඩ | 1,224,000.00 |
| මීරිගම | 1,224,000.00 |
| අත්තනගල්ල | 1,218,000.00 |
| ජා ඇල | 1,572,000.00 |
| වත්තල | 1,224,000.00 |
| මහර | 1,224,000.00 |
| දොම්පෙ | 1,224,000.00 |
| කැළණිය | 1,203,000.00 |
| බියගම | 1,224,000.00 |
| එකතුව | 16,215,000.00 |

## 1.14. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා වැඩසටහන.

2012 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා වැඩසටහන් මූලිකවම අංශ තුනක් ඔස්සේ සිදු කෙරිණ.

1. **රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා වන වැඩසටහන් :-**
   **'භාෂා සංගම් ජාතික ව්‍යාපාරය'** හරහා ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි භාෂා සංගම් 59 ක් පිහිටුවා ඇත. එම භාෂා සංගම් හරහා දෙමළ/සිංහල භාෂා ඉගැන්වීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍ය ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ සංකල්පයකට අනුව 'ද්වි භාෂාවෙන් හෘදයාංගමව බැඳුන එකම ලාංකේය ජාතියක් ගොඩනගමු'යන්න තේමා කරගනිමින් මෙම වැඩසටහන දීපව්‍යාප්තව ක්‍රියාත්මක කෙරේ.

රාජ්‍ය නිළධාරීන්ට භාෂා ප්‍රවීණතා ලබා දීමට අමතරව ග්‍රාමීය මට්ටමින් කුඩා සමිති පිහිටුවා ඒ මගින් ශ්‍රී ලංකාවේ සියළුම ජන කොටස් වලට තම භාෂා අයිතීන් සුරක්ෂිත කර ගැනීමට අවශ්‍ය පසුබිම සැකසේ. ඒ හරහා භාෂා වර්ධන වැඩසටහන් 42 ක් දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක විය. වැය වූ මුදල රු. 1,800,000/= කි.
තවද, වත්තල සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ද්විභාෂා සහන කවුළු විවෘත කිරීම තුළින් ජනතාවට තම භාෂා අයිතීන් සුරක්ෂිත කර ගැනීමේ අවකාශය අමාත්‍යංශය මඟින් සළසා ඇත.

2. **සමාජ ඒකාබද්ධතා වැඩසටහන් :-**
සිංහල, දෙමළ, මුස්ලිම් සහ ක්‍රිස්තියානි යන සියළු ආගම් පාදක කරගනිමින් යෙදෙන ආගමික උත්සව සැමරීමට වැඩසටහන් සංවිධානය කෙරේ. ඒ අනුව ජා ඇල භාෂා සංගම් මගින් තෛපොංගල් උත්සවය, සිංහල - දෙමළ අළුත් අවුරුදු උත්සවය, වෙසක් උත්සව සහ රාමසාන් උත්සවය පවත් වන ලදී. මීගමුව කොට්ඨාශයේ නත්තල් උත්සවය ද අත්තනගල්ල කොට්ඨාශයේ රාමසාන් උත්සවය ද පැවැත් වීය.

සමාජ ඒකාබද්ධතා සතිය තේමා කර ගනිමින් 2012 ජූලි මස ජා ඇල කොට්ඨාශයේ දඹුව ප්‍රජා ශාලාවට ද්විත්ව වැසිකිළියක් ලබාදීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. වැය වූ මුදල රු. 150,000/= කි.

3. **නීති ආධාර වැඩසටහන් :-**
ගම්පහ, දොම්පෙ සහ කටාන යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ජනතාවට නීති ආධාර කොමිෂන් සභාවේ ගම්පහ ශාඛාව මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 1 . 15 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතේ මෙම කාර්යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ සිටින නිලධාරීන් විසින් ඉටුකරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

| වැඩසටහන | වාර්ෂික ඉලක්ක | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් | මුදල (රු.) | රැකියාගත කිරීම් |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය පෙළ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 67 | 77 | 2571 | 0 | |
| උසස් පෙළ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 43 | 45 | 1877 | 0 | |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 1 | 1 | 24 | 1,250.00 | |
| ස්වයංරැකියා පෙළඹවීම | 5 | 6 | 180 | 6,720.00 | |
| වෘත්තීය අභියෝග ජයගැනීම | 5 | 8 | 296 | - | |
| බාහිර උපාධිධාරී වැඩසටහන | 0 | 1 | 40 | - | |
| අභ්‍යන්තර උපාධිධාරී වැඩසටහන | 1 | 0 | 0 | 0 | |
| වෘත්තීය කාර්ය සාධනය වැඩි දියුණු කිරීම ( පුද්ගලයින් ) | 390 | | 839 | | |
| වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම (පුද්ගලයින් වැඩසටහන් මගින් හා වෙනත්) | 312 | 2 | 1547 | 0 | 0 |
| රැකියා සමාජ වැඩසටහන | 3 | 3 | 77 | - | 14 |
| ප්‍රාදේශීය රැකියා පොළ | 1 | 3 | 1277 | 6,000.00 | 102 |
| රැකියා ගවේෂණ වැඩසටහන් | 6 | 5 | 536 | 0 | 122 |
| පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම | 0 | 0 | 0 | 0 | 0 |
| නිදහස් රැකියා සඳහා පෙළඹවීමේ වැඩසටහන | 0 | 0 | 0 | 0 | 0 |
| ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ වැඩසටහන | 0 | 0 | 0 | 0 | 0 |
| සෘජු රැකියා ලබාදීම (වෙනත්) | 150 | | | | 257 |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 1 | 1 | 30 | 14,610.00 | |
| අවශ්‍යතාමත පුහුණු වැඩසටහන | 3 | 9 | 218 | - | |
| ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ( ණයදීම ) | | | 161 | 10,130,000.00 | 51 |

මූලාශ්‍රය : වෘත්තීය මාර්ගෝපදේශ අංශය , ගම්පහ

## 1. 16. ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන්

ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යංශය විසින් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අංශ වශයෙන් පහතින් දැක් වේ.

1. පාසල් අංශ සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන

2. රාජ්‍ය අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන

3. පෞද්ගලික අංශය සඳහා ඵලදායිතා පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන

4. ප්‍රජා ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

5. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති

    1. කයිසෙන් ව්‍යවසායක වැඩසටහන

        ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතියක් වන කයිසෙන් ව්‍යවසායකයෝ වැඩසටහන මගින් සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතා සංකල්ප භාවිතයෙන් වැඩි දියුණු කරන අතර, මෙම වැඩසටහන ආයතන 150 ක ක්‍රියාත්මකය. එමගින්

        - ආයතන තුළ ඵලදායිතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
        - ඵලදායිතා සම්මාන ලාභි ආයතන නැරඹීමට යාම
        - දිස්ත්‍රික්කය තුළ ආයතන මට්ටමින් දැනුම හුවමාරු කර ගැනීම
        - ජාත්‍යන්තර මට්ටමේ පුහුණු අවස්ථා ලබාදීම
        - වාර්ෂික සුහද හමුව සහ ක්‍රිකට් තරගාවලිය
        - ජාතික ඵලදායිතා සම්මානයට ඉදිරිපත් කිරීම
        - නව රැකියා බිහි කිරීම

    2. ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයන් සඳහා සමෘද්ධි අධිකාරිය සමග ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන "දිරි දිවිය" ව්‍යවසායකයෝ වැඩසටහන

        ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සමෘද්ධි අධිකාරිය එක්ව ගම්පහ දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයන් සඳහා ආරම්භ කරන ලදී. මෙමගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් තෝරා ගන්නා ලද ව්‍යාපාර 10 බැගින් 130 ක් තෝරාගෙන ඵලදායිතා සංකල්ප භාවිතයෙන් වැඩිදියුණු කෙරේ.

    3. ගම්පහ දිස්ත්‍රික් මහජන බැංකු සඳහා වූ ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

        මෙමගින් දිස්ත්‍රික්කය පුරා ඇති මහජන බැංකු ශාඛා කාර්යාල 58 ක් සඳහා ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා 5S පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා 5S අත්පොතක් නිර්මාණය කර මුද්‍රණය කිරීම. මේ තුළින් අවසානයේ 5S තරගාවලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

    4. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ආරම්භ කරන ලද පොලිස් ස්ථාන තුළ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම පොලිස් ස්ථාන වල මෙම වැඩසටහන ආරම්භ කිරීම.

**1. 17. ක්‍රීඩා කටයුතු**

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශය විසින් ගම්පහ දිස්ත්‍රික් ලේකම් මගින් ක්‍රීඩා වැඩසටහන් පවත්වනු ලැබේ.
ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි ලියාපදිංචි ක්‍රීඩා සමාජ සංඛ්‍යාව 610 කි. එම ක්‍රීඩා සමාජ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා තරග 42 ක් සඳහා ඉදිරිපත්කර ඇත. ප්‍රාදේශීය මට්ටමේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හි ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන 30 ක් ක්‍රියාත්මක වන අතර ක්‍රීඩා නිලධාරීන් 13 දෙනෙකු හා පුහුණුකරුවන් දෙදෙනෙක් සේවය කරනු ඇත. පළාත් ක්‍රීඩා අමාත්‍යංශය, පළාත් පාලන ආයතන, අධ්‍යාපන අමාත්‍යංශය යටතේ පවතින ක්‍රීඩාංගන 90 ක පමණ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.
ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතාවයන් උරගා බැලීම සඳහා ජාතික දක්ෂතා තලයට ගෙන ඒමට ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ මට්ටමින් අන්තර් ක්‍රීඩා සමාජ තරගත්, දිස්ත්‍රික් මට්ටමින් අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තරගත් ඉතා උසස් මට්ටමින් පවත්වා දක්ෂතාවයන් ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා එයින් අනතුරුව දිස්ත්‍රික් තරග වලටත්, බස්නාහිර පලාත් තරග වලටත් යොමු කරන ලදී. මෙම බස්නාහිර පළාත් තරග වලින් ගම්පහ දිස්ත්‍රික්කය විශිෂ්ට ලෙස ජයග්‍රහණය කරන ලදී. සමස්ත ශූරතාවය හා මලල ක්‍රීඩා ශූරතා දෙකම ගම්පහ දිස්ත්‍රික්කය දිනාගන්නා ලදී. ඉන් අනතුරුව ජාතික මට්ටමේ පැවැත්වූ ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කල ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශාල පිරිසක් රන්, රිදී, ලෝකඩ පදක්කම් දිනාගනිමින් බස්නාහිර පළාත ජාතික මහා ක්‍රීඩා උළෙලේ ශූරතාවය දිනාගැනීමට දායකත්වය දෙන ලදී. තවද මීටර් 400 න් දුලාජ් මදුශංක ක්‍රීඩකයා ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතාවය සඳහා රන් පදක්කම දිනා ගන්නා ලදී.
2012 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී ක්‍රීඩාංගන ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශය යටතේ ප්‍රතිපාදන වෙන්කර ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදී. මලල ක්‍රීඩා , වොලිබෝල් ක්‍රීඩා පිටි විශාල ප්‍රමාණයක් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අවශ්‍යතාවය සඳහා සකස් කරන ලදී. ක්‍රීඩා සමාජ වලට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ලක්ෂ 100 ක පමණ ලබා දී ඇත. ඊට අමතරව ක්රීඩා නිලධාරීන්ට හා පුහුණුකරුවන්ට නව තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ අරමුණෙන් පුහුණු කදවුරු පවත්වන ලදී. මේ සඳහා බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යංශය , ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහයෝගය සහ ගරු පලාත් සභා මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිපාදන යටතේ පුහුණු වැඩසටහන් සඳහා මුදල් වෙන් කර දෙන ලදී.

# 02. පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අංශය

**01. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. මහා පරිමාණ, මධ්‍යම හා සුලු පරිමාණ කළුගල් කැණීම් කර්මාන්ත සඳහා පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරිම හා පුපුරන ද්‍රව්‍ය වාරික නිකුත් කිරීම.
2. ඉදිකිරීම් කටයුතු වලදී අවහිර වන කළුගල් ඉවත් කිරිම සඳහා පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම.
3. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය වන පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර නිකුත් කිරීම.
4. ගිණිකෙළි කර්මාන්තය, තීන්ත/ආලේපන හා මදුරු දගර කර්මාන්තය සඳහා අවශ්‍ය පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර හා අවසරපත්‍ර නිකුත් කිරීම.
5. පරීක්ෂණ පිපුරුම් හා ක්ෂෙත්‍ර කටයුතු සඳහා සහභාගි වීම.
6. ගිණිකෙළි කර්මාන්තයන් සඳහා වැඩමුළු පැවැත්වීම.
7. කාර්මික පුපුරන ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා වූ පාඨමාලාවේ දේශන පැවැත්වීම.
8. වෝටර් ජෙල් කර්මාන්තයට සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
9. සේවා නුල් හා ගල් වෙඩි බෙහෙත් කර්මාන්තයට සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
10. කර්මාන්ත කරුවන්ගේ අවශ්‍යතාව මත පුපුරන ද්‍රව්‍ය පනතට ගැනෙන පුපුරණ ද්‍රව්‍යන් ආනයනය කිරීමට හා අපනයනයට අදාල බලපත්‍ර නිකුත් කිරීම.

11. බලයලත් පුපුරන ද්‍රව්‍ය අලෙවි නියෝජිතයන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා ඔවුන්ගේ තොග ගබඩා සම්බන්ධ අධීක්ෂණ කටයුතු.

12. පුපුරන ද්‍රව්‍ය ගබඩා ප්‍රතිස්ථානගත කිරීමේ දීප ව්‍යාප්ත වැඩපිළිවලට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන හතරක නව ගබඩා සංකීර්ණ හතරක් ප්‍රතිස්ථානගත කිරීම.

**02. 2012 වර්ෂය තුල පුපුරන ද්‍රව්‍ය අංශය වෙත ලද අවසරපත්‍ර / බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව.**

| ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|
| පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 454 |
| පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 210 |

**03. 2012 වර්ෂය තුල නිකුත් කල අවසරපත්‍ර , බලපත්‍ර (වර්ග අනුව) හා අවසරපත්‍ර / බලපත්‍ර ගාස්තු ලෙස ලද ආදායම**

| නිකුත් කල අවසරපත්‍ර වර්ගය | සංඛ්‍යාව | ආදායම (රු) |
|---|---|---|
| කළුගල්, ගිනි පෙට්ටි, ඖෂධ නිපදවීම, මදුරු දඟර කර්මාන්ත හා පොදු කටයුතු සඳහා | 453 | 109,650 |

| නිකුත් කල බලපත්‍ර වර්ගය | සංඛ්‍යාව | ආදායම (රු) |
|---|---|---|
| නිෂ්පාදන, සපයන්නා, ආනයන හා අපනයන බලපත්‍ර | 205 | 173,850 |

**04. 2011 වර්ෂය සමග සංසන්දනය කිරීමේදී 2012 වර්ෂය තුල පුපුරන ද්‍රව්‍ය අංශය වෙත ලද අවසරපත්‍ර හා බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යා**

| ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව | 2011 වසර | 2012 වසර |
|---|---|---|
| පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 358 | 454 |
| පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව | 193 | 210 |




05. 2011 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2012 වර්ෂය තුල නිකුත් කල අවසරපත්‍ර හා බලපත්‍ර (වර්ග අනුව) සංඛ්‍යාව

| නිකුත් කල පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාව | 2011 වසර | 2012 වසර |
|---|---|---|
| නිකුත් කල පුපුරන ද්‍රව්‍ය අවසරපත්‍ර සංඛ්‍යාව | 350 | 453 |
| නිතුත් කල පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර සංඛ්‍යාව | 185 | 205 |



06. 2011 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී 2012 වර්ෂය තුල නිකුත් කල අවසරපත්‍ර හා බලපත්‍ර සංඛ්‍යාවට අදාලව ලද ආදායම.

| අවසරපත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම | 2011 වසර | 2012 වසර |
|---|---|---|
| අවසරපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම (රුපියල්) | 94,700 | 109,650 |
| බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම (රුපියල්) | 199,000 | 173,850 |




07. පුපුරන ද්‍රව්‍ය ගබඩා ප්‍රතිස්ථානගත කිරීමේ දීප ව්‍යාප්ත වැඩපිළිවලට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථාන හතරක නව ගබඩා සංකීර්ණ හතරක් ප්‍රතිස්ථානගත කිරීම.

| ප්‍රතිස්ථානගත කිරීමට පෙර ගබඩා පැවති ස්ථානය | ප්‍රතිස්ථානගත කරනු ලැබූ ස්ථානය | බලයලත් පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර හිමියන් සංඛ්‍යාව | බලයලත් පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කටාන පොලිස්ථානය | කටාන, ඉඹුල්ගස් වාඩිය | 2 | 1 |
| කොටදෙනියාව පොලිස්ථානය<br>දිවුලපිටිය පොලිස්ථානය | වල්පිට, දොඹවින්න වත්ත | 2 | - |
| ගම්පහ පොලිස්ථානය<br>නිට්ටඹුව පොලිස්ථානය | නිට්ටඹුව, ඕවඩි වත්ත | 4 | 2 |
| සපුගස්කන්ද පොලිස්ථානය<br>දොම්පෙ පොලිස්ථානය | කිරිදිවැල, මාලිගා වත්ත | 2 | - |

# 03. දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය

## 3.1 2012 විමධ්‍යගත මුලධන අයවැය ක්‍රියාත්මක වැඩසටහන - ගම්පහ දිස්ත්‍රික්කය

2012 වර්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට වෙන්වන ප්‍රතිපාදන යටතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම සඳහා, විමධ්‍යගත අයවැය වැඩසටහනට අදාලව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විසින් යෝජනා කරන ලද ව්‍යාපෘති ඇතුලත්, විමධ්‍යගත අයවැය සැලැස්ම, 2012.05.09 දින, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින්, අනුමත කර එවන ලදි.

ගම්පහ දිස්ත්‍රික්කය සඳහා තේරී පත්වූ, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා 18 දෙනා වෙනුවෙන් රු.මිලි.5 බැගින්, රු.මිලි.90 කට අදාල ව්‍යාපෘති 680 ක් හා ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා 10 දෙනා විසින්, රු.මිලි.10.07 කට අදාල ව්‍යාපෘති 67 ක්ද වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණ වන පරිදි, ව්‍යාපෘති 747 ක් එම සැලැස්මට ඇතුලත්වූ අතර, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලි.100.07 ක ප්‍රතිපාදන වෙන්කරන ලදි.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ, MED/D/DCB/Gen/12 හා 2012.01.28 දිනැතිව එවන ලද, "විමධ්‍යගත අයවැය 1/2012 " චක්‍රලේඛය අනුව, 2012 වර්ෂයේ විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, ව්‍යාපෘති 738 වැඩ නිමකර, 100%ක මූල්‍ය ප්‍රගතියක් දැක්වීමට සමත් විය. නොවැලැක්විය හැකි හේතූන් මත ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක නොවීම නිසා, එම ව්‍යාපෘති අහෝසි විය.

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාශය | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති ගැන්වූ මුදල(රු) | මූල්‍ය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල් ගෙවූ ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවා ඇති මුදල(රු) | පුනරාවර්තන වියදම(රු) | මුළු වියදම(රු) |
| 1 | දිවුලපිටිය | 36 | 4,532,675 | 36 | 4,465,399 | 65,000 | 4,530,900 |
| 2 | කටාන | 41 | 4,194,380 | 41 | 4,0807,26 | 88,625 | 4,168,829 |
| 3 | මීගමුව | 40 | 6,464,500 | 40 | 6,013,788 | 74,520 | 6,088,309 |
| 4 | මිනුවන්ගොඩ | 55 | 9,136,100 | 55 | 9,082,934 | 107,321 | 9,190,255 |
| 5 | මීරිගම | 89 | 9,769,870 | 89 | 9,488,854 | 71,612 | 9,560,466 |
| 6 | අත්තනගල්ල | 68 | 8,167,598 | 68 | 7,897,770 | 106,317 | 8,004,087 |
| 7 | ගම්පහ | 58 | 8,641,350 | 57 | 8,357,009 | 124,759 | 8,481,768 |
| 8 | ජා-ඇල | 76 | 12,641,498 | 75 | 12,312,585 | 91,070 | 12,403,655 |
| 9 | වත්තල | 47 | 5,405,000 | 45 | 5,168,416 | 64,144 | 5,232,560 |
| 10 | මහර | 50 | 6,033,755 | 48 | 5,657,175 | 82,261 | 5,739,436 |
| 11 | දොම්පෙ | 53 | 5,787,851 | 50 | 5,446,120 | 82,000 | 5,528,120 |
| 12 | බියගම | 62 | 7,442,813 | 62 | 7,061,262 | 66,269 | 7,127,531 |
| 13 | කැලණිය | 62 | 3,825,000 | 62 | 3,707,298 | 91,349 | 3,798,647 |
| 14 | දිස්ත්‍රික් ලේකම් | 10 | 5,050,250 | 10 | 5,006,324 | 82,103 | 5,088,427 |
| | එකතුව | 747 | 97,092,640 | 738 | 93,745,139 | 1,197,852 | 94,942,990 |

මුලාශ්‍රය : දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය, ගම්පහ

## 3.2 ගම්පහ දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන - 2012

ගම්පහ දිස්ත්‍රික් පරිපාලන බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබද තොරතුරු එක්රැස් කොට එකම වැඩසටහනක් යටතේ සංගෘහිත කිරීම මෙම සැලැස්ම මගින් ඉටු කරනු ලබයි.
දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන සකස් කිරීමේ දී දිස්ත්‍රික්කයට අරමුදල් ලැබෙන මූල්‍ය ප්‍රභවයන් 6ක් යටතට ඇතුළත් කර සැලැස්ම සකස් කර ඇත. ඊට අදාළ ව්‍යාපෘති සම්බන්ධීකරණය කර මෙහෙයුම් කටයුතු අවශ්‍ය ආකාරයෙන් සිදු කිරීම සදහා එක් එක් අරමුදල් ප්‍රභවයන් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති අංශ 7ක් යටතට ඇතුළත් කර පහත සදහන් පරිදි දක්වා ඇත.

**මුදල් ලැබෙන ප්‍රභවය**

1. විමධ්‍යගත අරමුදල්
2. මධ්‍යම රජයේ ඒබීය අරමුදල්
3. පළාත් සභා අරමුදල්
4. පළාත් පාලන ආයතන අරමුදල්
5. විශේෂ ව්‍යාපෘති (විදේශාධාර ඇතුළත්)
6. ව්‍යවස්ථාපිත මණ්ඩල

**ආංශික වර්ගීකරණය**

1. කෘෂිකර්මය
2. කර්මාන්ත හා වෙළෙදාම
3. මානව ජනාවාස
4. ආර්ථික යටිතල පහසුකම්
5. ප්‍රවාහන පහසුකම්
6. සමාජ යටිතල පහසුකම්
7. පරිපාලන පොදු කාර්යය

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් සම්බන්ධීකරණය හා මෙහෙයුම් කිරීම සඳහා මෙම සැලැස්ම උපයෝගී කරගනු ලැබේ. එසේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය හා මෙහෙයුම් කිරීම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් සිදු කරනු ලබයි.

2012 දිස්ත්‍රික් වාර්ෂික ඒකාබද්ධ ක්‍රියාත්මක වැඩසටහන 111 වන කාර්තුව අවසානයට වාර්තා වී ඇති තොරතුරු අනුව ප්‍රතිපාදන හා වියදම බෙදී යාම.

**ආංශික වර්ගීකරණයට අනුව බෙදී යාම**

| අනු අංකය | ආංශික වර්ගීකරණය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල (රුː මිලි) | වියදම (රුː මිලි.) |
|---|---|---|---|---|
| 1 | කෘෂිකර්මය | 2541 | 1229 | 863 |
| 2 | කර්මාන්ත, සංචාරක කටයුතු හා වෙළෙඳාම | 2183 | 799 | 239 |
| 3 | මානව ජනාවාස | 2188 | 4122 | 1631 |
| 4 | ආර්ථික යටිතල පහසුකම් | 524 | 136 | 4 |
| 5 | ප්‍රවාහනය | 3425 | 36331 | 19679 |
| 6 | සමාජ යටිතල පහසුකම් | 2953 | 1870 | 573 |
| 7 | පරිපාලන පොදු කාර්ය | 145 | 244 | 150 |
| **එකතුව** | | 13959 | 44731 | 23139 |



**අරමුදල් මූලාශ්‍ර අනුව බෙදී යාම**

| අනු අංකය | අරමුදල් ප්‍රභවය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු: මිලි.) | වියදම (රු: මිලි.) |
|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය | 576 | 71 | 8 |
| 2 | රේඛීය අමාත්‍යාංශ (ආර්ථික සංවර්ධන අමා. හැර) | 1049 | 21033 | 13564 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 1177 | 2330 | 1444 |
| 4 | සමෘද්ධි අධිකාරිය | 2223 | 61 | 0 |
| 5 | පළාත් සභා | 2946 | 1425 | 268 |
| 6 | පළාත් පාලන ආයතන | 4387 | 2354 | 532 |
| 7 | විදේශාධාර හා විශේෂ ව්‍යාපෘති | 446 | 14846 | 5748 |
| 8 | ව්‍යවස්ථාපිත මණ්ඩල | 1155 | 2611 | 1574 |
| **එකතුව** | | **13959** | **44731** | **23139** |

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව බෙදී යාම**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල (රු: මිලි) | වියදම (රු: මිලි.) |
|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 827 | 525 | 304 |
| 2 | කටාන | 548 | 790 | 427 |
| 3 | මීගමුව | 310 | 1767 | 785 |
| 4 | මිනුවන්ගොඩ | 469 | 223 | 112 |
| 5 | මීරිගම | 769 | 1284 | 101 |
| 6 | අත්තනගල්ල | 829 | 977 | 94 |
| 7 | ගම්පහ | 859 | 1525 | 974 |
| 8 | ජා-ඇල | 422 | 829 | 353 |
| 9 | වත්තල | 463 | 258 | 120 |
| 10 | මහර | 436 | 1060 | 713 |
| 11 | දොම්පේ | 992 | 765 | 210 |
| 12 | බියගම | 400 | 1489 | 815 |
| 13 | කැළණිය | 210 | 708 | 428 |
| 14 | පොදු (පළාත් සභා ව්‍යාපෘති ඇතුළුව) | 6425 | 32530 | 17704 |
| **එකතුව** | | **13959** | **44731** | **23139** |

මූලාශ්‍රය : දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලය, ගම්පහ

## 3.3. ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කෙරෙන, එහිදී මතුවන ගැටළු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන දිස්ත්‍රික්කයේ ප්‍රධානතම කමිටුව , දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වේ.

දිස්ත්‍රික් සැළසුම් කමිටුව , ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු 13, නිවාස කමිටුව, පරිසර කමිටුව, කෘෂිකර්ම කමිටුව, ධීවර කමිටුව, සමෘද්ධි කමිටුව, මිල කමිටුව ,අමා කමිටුව, ශාසනාරක්ෂක බල මණ්ඩලය ,දිස්ත්‍රික් වන කමිටුව යන අනු කමිටු 11 කින් මෙම කමිටු සකස් වී ඇත.

අති ගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා හා බස්නාහිර පලාත් ප්‍රධාන අමාත්‍ය , ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතීත්වය උසුලයි.

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන් ,පලාත් සභා මන්ත්‍රීතුමන්, පලාත් පාලන ආයතන ප්‍රධානීන් , දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. ගම්පහ දිස්ත්‍රික් ලේකම් , කමිටුවේ ලේකම් වන අතර දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය , කමිටු ලේකම් කාර්යාලය ලෙස කටයුතු සිදු කරනු ලබයි.

2012 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර 2 ක් 2012.06.25 හා 2012.10.04 දිනයන්හිදී පවත්වන ලදී.

2012 වසරේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය සහ සංවර්ධන විභවතා පිළිබඳව දීර්ඝ වශයෙන් මෙහිදී සාකච්ඡා කරන ලදී. මෙයට අමතරව කෘෂිකර්මය, වාරි මාර්ග, කර්මාන්ත, ප්‍රවාහන , නගර සංවර්ධනය , අධ්‍යාපන , සමාජ සුභසාධනය සහ ආරක්ෂාව යන අංශ පිළිබඳව සාකච්ඡා කර , ඉදිරි සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී.

## 3. 4. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන විශේෂ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම

දිස්ත්‍රික් හා පළාත් සංවර්ධන කටයුතු පිළිබඳව ප්‍රගතිය දිස්ත්‍රික් මට්ටමින් සමාලෝචනය කිරීම මෙම රැස්වීම් මාලාවේ අරමුණ වේ. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන මෙම රැස්වීමේදී සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය වඩාත් සාර්ථකව පසු විපරම් කිරීම සඳහා වගකීම් පැවරී ඇති සියළුම නිලධාරීන් එක්ව අමාත්‍යංශ හා ආයතන මට්ටමින් සාකච්ඡා කිරීම මෙහිදී සිදු වේ.

මෙහි ප්‍රථම රැස්වීම පළාත් මට්ටමින් 2010.10.09 වන දින පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේදී පැවැත්වුණු අතර, මෙහි අවසාන රැස්වීම 2012.07.14 වන දින පත්තලගෙදර සියනෑ අධ්‍යාපන විද්‍යා පීඨයේදී පවත්වනු ලැබිණි. මෙම රැස්වීම සඳහා දේශපාලන නායකත්වය සහ රාජ්‍ය නිලධාරීන් පළාත් මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් අවස්ථා දෙකෙහිදීම සහභාගි විය.

දිස්ත්‍රික්කයට අදාළව 2016 දී සපුරා ගතයුතු ඉලක්ක, විශේෂයෙන් හඳුනා ගනු ලැබූ ගැටළු හා අතිගරු ජනාධිපතිතුමාගේ නමින් නම් කර අතරමඟ නවතා දමා ඇති ඉදිකිරීම් ඇතුළුව දිස්ත්‍රික්කය තුළ දැනට ජාතික මට්ටමින් විසඳා ගතයුතු ගැටළු මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සාකච්ඡාවට බඳුන් කෙරෙයි.

මෙම ගැටළු වලට අදාළව ගනු ලැබූ තීරණ හා සෑම ගැටළුවක් සම්බන්ධයෙන්ම වගකීම දරනු ලබන ආයතනය හරහා ලබා ගත් තොරතුරු අනුව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය වෙත මාසිකව ප්‍රගතිය වාර්තා කරනු ලබයි.

## 3.5. දිවි නැගුම වැඩසටහන - 2012

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ගෘහ ආර්ථික ඒකක ශක්තිමත් කිරීමේ අරමුණින් ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය, පශු සම්පත් හා ධීවර සහ ගෘහ කර්මාන්ත යන අංශ සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය

### 1.) ගෙවතු සංවර්ධන වැඩසටහන

දිවිනැගුම වැඩසටහන යටතේ 2012 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 1176 ක ගෘහ ආර්ථික ඒකක 176400 ක් සංවර්ධන කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර, **සමෘද්ධි** සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභීන් යන පසුකාරකයින්ගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරන ලදී.

මේ යටතේ ගෘහ ආර්ථික ඒකක සඳහා බීජ පැකට් බෙදා දෙන ලදී . III වන අදියර යටතේ බීජ පැකට් 176,883 ක් පවුල් ඒකක 176,883 සඳහාද IV වන අදියර යටතේ පවුල් ඒකක 516,800 ක් සඳහා බීජ පැකට් 516,800 ක්ද බෙදා දෙන ලදී .

- **පොල් පැළ ලබාදීම**

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ම ආවරණය වන පරිදි පොල් පැළ 68,770 ක් බෙදා දෙන ලද අතර මේ සඳහා රු.5,157,750 ක වියදමක් දරා ඇත.

- **පලතුරු පැළ ලබාදීම**

සමස්ථ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය වන පරිදි අඹ, රඹුටන්, අන්නාසි, පේර ආදී පලතුරු පැළ 368,463 ක් ප්‍රතිලාභී පවුල් 147,569 ක් අතරේ බෙදා දෙන ලද අතර මේ සඳහා රු.11,625,867 ක මුදලක් වැය කර ඇත.

- **සුළු අපනයන බෝග පැළ ලබාදීම**

2012 වර්ෂයේ ගෘහ ආර්ථික ඒකක සඳහා ගම්මිරිස් හා කුරුඳු පැළ ලබා දෙන ලදී . මේ යටතේ පැළ 22,040 ක් බෙදා දෙන ලද අතර රු.315,637 ක මුදලක් වැය කර ඇත.

- **ස්ථිර බෝග පැළ ලබාදීම**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කොස් ,තේක්ක ආදී ස්ථිර බෝග පැළ 1,514 ක් බෙදා දී ඇති අතර දරා ඇති වියදම රු.219,330 කි.

- **එළවළු පැළ ලබාදීම**

මේ යටතේ එළවළු පැළ 148,717 ක් බෙදා දී ඇති අතර දරන ලද වියදම රු.4,637,944 කි. මිටිමුරුංගා , බටු ,ගෝවා, අමුමිරිස් ,තක්කාලි ආදී පැළ වර්ග මේ යටතේ බෙදා දෙන ලදී.

## 2.) පශු සම්පත් සංවර්ධන අංශය

- **ගෘහාශ්‍රිතව  කිකිළියන් ඇති කිරීමේ වැඩසටහන**

දිවි නැගුම වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ගෘහ ආර්ථික ඒකක 4160 ක් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 41,460ක් ලබා දී ඇති අතර, ඒ වෙනුවෙන් රුපියල් මිලියන 14.51 ක මුදලක් වැය කර ඇත.

- **කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ ආදර්ශ තෘණ වගා ඒකක 50 ක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් 633000/- ක මුදලක් වැය කර ඇත .

- **ගෘහ කර්මාන්ත වැඩසටහන**

  විවිධ ක්ෂේත්‍ර යටතේ ගෘහ කර්මාන්ත කරුවන් 1485 දෙනෙකු පුහුණු කර නව ගෘහ කර්මාන්ත ඇරඹීමට සහ පවත්නා කර්මාන්ත වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ ලබා දෙන ලදි. ඒ සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 20.5 කි .

- **ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන**

  ප්‍රදේශ පාදක සම්පත් භාවිතයට ගනිමින් පිහිටුවන ලද ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝධිපිහිටුවල කළුගල් නිශ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් 52 ක් සඳහා රුපියල් 602,112 /- මුදලක් වැය කර උපකරණ ලබා දෙන ලදි.

## 3.6. පළාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන

2011 දී ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ මාර්ග 162 ක් (කි.මී.326) ක් කාපට් කිරීමට නියමිතව ඇත. මෙහි ව්‍යාපෘති ක්‍රියාත්මක ආයතනය ලෙස පලාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලබන අතර අධීක්ෂණ ආයතනය ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

2012.12.31 වන විට පලාත් මාර්ග කාපට් කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපෘති 113 ක් නිම කරනු ලැබූ අතර ව්‍යාපෘති 49 ක් ක්‍රියාත්මක තත්වයේ පැවතුණි. නිම කරන ලද ව්‍යාපෘති සඳහා රු.මී.2,730.83 ක් ගෙවන ලදී

## 3.7. ගම්පහ නගර සංවර්ධන වැඩසටහන

ගම්පහ නගරය විධිමත් නගරයක් බවට පත්කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- ගම්පහ දුම්රිය පොළ අසල මගී පාලම ඉදිකිරීම.
- දුම්රිය නිලනිවාස පහක් ඉදිකිරීම.
- ගම්පහ නගර සංවර්ධන ව්‍යාපෘති (I හා II )

මෙම වැඩසටහන සඳහා 2012 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මී.19.16ක් වැය කර ඇත. දුම්රිය පොළ අසල මගී පාලම හා දුම්රිය නිලනිවාස ඉදිකිරීම මෙම වසරේදී නිම කරනු ලැබූ අතර නගර සංවර්ධන ව්‍යාපෘති 2013 වසරට අවිච්ඡේද විය.

## 3. 8. මාතෘ හා ළමා සායන වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඍජු ප්‍රතිදාන යටතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන, මාතෘ හා ළමා සායන වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ, සායන 24ක් වැඩිදියුණු කිරීම සඳහා, රු.මිලි.214.44ක මුදලක් වෙන්වූ අතර, 2012 වර්ෂය අවසන් වන විට, එම ව්‍යාපෘති 24 හිම වැඩ නිම කිරීමට හැකිවිය.

| අනු අංකය | සායනය | වෙන්වූ මුදල(රු) |
|---|---|---|
| 1 | බියගම- මාවරමණ්ඩිය | 5,000,000 |
| 2 | දොම්පෙ- කිරිඳිවැල වෑකෙ | 6,000,000 |
| 3 | මහර- දළුවපිටිය | 4,967,000 |
| 4 | ගම්පහ- වැලිවේරිය | 2,000,000 |
| 5 | ගම්පහ- මාකෙවිට | 2,000,000 |
| 6 | ගම්පහ- කොස්සින්න | 1,150,000 |
| 7 | කටාන- දෙමංහන්දිය මාතෘ සායනය | 7,291,313 |
| 8 | කටාන- කැබැල්ලගස්හන්දිය | 6,808,028 |
| 9 | වත්තල- උස්වැටකෙයියාව | 4,641,991 |
| 10 | ජා-ඇල- බටගම | 8,444,650 |
| 11 | ජා-ඇල- කඳාන | 8,444,650 |
| 12 | මීගමව- කුඩාපාඩුව | 8,445,036 |
| 13 | මීගමුව- මුන්නක්කරය | 2,196,646 |
| 14 | මීරිගම- මීවිටිය | 6,901,826 |
| 15 | මීරිගම- මාලිගාතැන්න | 4,040,518 |
| 16 | අත්තනගල්ල- වල්ගම්මුල්ල මාතෘ සායනය | 3,961,646 |
| 17 | අත්තනගල්ල- හොරගොල්ලාගම | 5,599,988 |
| 18 | මිනුවන්ගොඩ- නයිවල මාතෘ සායනය | 4,719,877 |
| 19 | මිනුවන්ගොඩ- පත්තඬුවන | 3,778,240 |
| 20 | මහර- ගොංගිතොට | 8,005,197 |
| 21 | කැලණිය- පෑලියගොඩ මාතෘ සායනය | 2,199,163 |
| 22 | කැලණිය- දලුගම්ගොඩ | 2,026,463 |
| 23 | දිවුලපිටිය- හල්පෙ කටාන | 2,844,278 |
| 24 | දිවුලපිටිය- කටුවැල්ලේගම | 1,910,008 |
|  | එකතුව | 113,376,518 |

## 3. 9. සතිපොළ සංවර්ධන වැඩසටහන - 2012

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඍජු ප්‍රතිදාන යටතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක වන, සතිපොළ සංවර්ධන වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී සතිපොළ 13ක් ඉදිකිරීමට රු.මිලි.622.34ක මුදලක් වෙන් කර තිබූ අතර, ඉන් සතිපොළ 10ක වැඩ නිම කිරීමට හැකි විය.

| අනු අංකය | සතිපොළ | වෙන්වූ මුදල(රු) |
|---|---|---|
| 1 | මිනුවන්ගොඩ සතිපොළ | 64.77 |
| 2 | නයිවල සතිපොළ | 37.41 |
| 3 | බෝපිටිය සතිපොළ | 34.32 |
| 4 | බඩල්ගම සතිපොළ | 33.85 |
| 5 | වැලිවේරිය සතිපොළ | 19.36 |
| 6 | මල්වතුහිරිපිටිය සතිපොළ | 49.10 |
| 7 | කිරිඳිවැල සතිපොළ | 119.11 |
| 8 | පූගොඩ සතිපොළ | 70.24 |
| 9 | පට්ටිවිල සතිපොළ | 27.61 |
| 10 | මාවරමණ්ඩිය සතිපොළ | 58.23 |
|  | එකතුව | 536.77 |

## 3. 10. ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු සකස් කිරීම

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඍජු ප්‍රතිදාන යටතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගාසිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන,_ව්‍යායාම සඳහා ඇවිදීමේ මංතීරු සකස් කිරීම වැඩසටහන යටතේ, 2012 වර්ෂයේදී මංතීරු 3ක වැඩ නිමකර ඇති අතර, ඒ සඳහා රු.මිලි. 162.5 ක මුදලක් වැයකර ඇත. බියගම, වත්තල, මිනුවන්ගොඩ ඇවිදීමේ මංතීරු 3 ඉදිවෙමින් පවතී.

| අනු අංකය | ව්‍යායාම මංතීරුව | වෙන්වූ මුදල(රු.මිලි.) |
|---|---|---|
| 1 | ගම්පහ උරුවල්ඔය කළුපාලම අසල | 35.5 |
| 2 | මුදුන්ඇල ආශ්‍රිතව කිරිබත්ගොඩ නගරය අසල | 69 |
| 3 | මහර දළුපිටිය | 58 |

## 3. 11. දත්ත තොරතුරු හා මෙහෙයුම් මැදිරිය

ගම්පහ දිස්ත්‍රික්කයට අදාල දත්ත තොරතුරු දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය මගින් එක් රැස් කරනු ලබන අතර වාර්ෂිකව මෙම තොරතුරු යාවත්කාලීන කරනු ලැබේ.

ජනගහනය,අධ්‍යාපනය,සෞඛ්‍ය,කෘෂිකර්මය ආර්ථික කටයුතු සංවර්ධන වැඩසටහන් ,මාර්ග ,සංස්කෘතික , මැතිවරණ සුභ සාධන කටයුතු ,ප්‍රදේශයේ භූ විෂමතා ලක්ෂණ ස්වභාවික සම්පත්,කර්මාන්ත ආදී විවිධ අංශයන් යටතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දත්ත තොරතුරු රැස් කරණු ලැබේ.

යාවත්කාලීන කල දත්ත තොරතුරු ඇතුලත් දිස්ත්‍රික් සම්පත් පැතිකඩ දත්ත තොරතුරු සංග්‍රහය සකස් කර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතයොමු කර ඇත

මීට අමතරව ගම්පහ දිස්ත්‍රිකයේ හදිසි ආපදා තත්වයන් පාලනය කිරීම සඳහාත් හදිසි සංවර්ධන කටයුතු හදුනාගැනීම සදහා භූගෝලීය තොරතුරු පද්ධතියක් සකස් කරන ලදි. මෙහි නියමු ව්‍යාපෘතිය කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක වු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 හිම ගෘහ මට්ටමින් තොරතුරු එක්රරැස් කරන ලදී. ආරක්‍ෂක අමාත්‍යාංශය හා කැළණිය විශ්ව විද්‍යාලය මේ සඳහා සහයෝගය දක්වන ලදී. සංවර්ධන කටයුතු හදුනාගැනීම සදහා

දිස්ත්‍රික්කයේ පාසල් රෝහල් පිළිබඳව සියලුම විස්තර ඇතුලත් දත්ත පද්ධතියක් සංවර්ධන කටයුතු හදුනාගැනීම පහසු වීම සඳහා සකස් කරන ලදී.

## 3. 12. ප්‍රාථමික පාසල් 5000 ක් ද්විතීක පාසල් දහසක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගැනිම හා දැනුම කේන්ද්‍රීය සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගනු වස් ද්විතීය පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් 5000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරා ගත් ප්‍රාථමික පාසල් 66 ක ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ එක් පාසලකට රුපියල් ලක්ෂ 5 බැගින් මිලියන 33ක ප්‍රතිපාදන රජය මේ සඳහා ආයෝජනය කරන ලදී.

වැඩසටහනේ මූලික අරමුණක් වූයේ පාසල් දරුවන් සඳහා අංග සම්පූර්ණ ප්‍රාථමික අධ්‍යාපනයක් තහවුරු කිරීම පිණිස පහසුකම් ඇති ප්‍රාථමික පාසල් පද්ධතියක් ප්‍රතිනිර්මාණය කිරීම බැවින් ප්‍රාදේශීය ලේකම්වරු හරහා පාසලට ආසන්න යුධ ගුවන් නාවුක සිවිල් ආරක්ෂක කඳවුරු, , ශිෂ්‍යභට බලකා සමග සාකච්ජා කර පුහුණු ශ්‍රමය /නුපුහුණු ශ්‍රමය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදි.







යටිහේන කණිෂ්ඨ විද්‍යාලය - බියගම

## ප්‍රාථමික පාසල් පන් දහසක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය -2012

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | අනුමතමුදල (රු.) | ඇස්තමේන්තු මුදල (රු.) | ප්‍රජා දායකත්වය (රු.) | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | ගෙවූ මුළු මුදල(රු.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 6 | 3,000,000.00 | 5,099,273.00 | 2,102,200.00 | 6 | 2,968,443.00 |
| 2 | කටාන | 4 | 2,000,000.00 | 3,440,763.00 | 1,440,763.00 | 4 | 2,000,000.00 |
| 3 | මීගමුව | 3 | 1,500,000.00 | 1,515,577.00 | 15,577.00 | 3 | 1,396,610.50 |
| 4 | මිනුවන්ගොඩ | 5 | 2,500,000.00 | 4,520,897.00 | 2,020,897.00 | 5 | 2,500,000.00 |
| 5 | මීරිගම | 8 | 4,000,000.00 | 4,091,649.00 | 91,649.00 | 8 | 4,000,000.00 |
| 6 | අත්තනගල්ල | 7 | 3,500,000.00 | 8,556,325.00 | 5,056,325.00 | 7 | 3,474,110.00 |
| 7 | ගම්පහ | 4 | 2,000,000.00 | 2,832,162.00 | 832,162.00 | 4 | 1,982,653.00 |
| 8 | ජාඇළ | 4 | 2,000,000.00 | 3,300,000.00 | 1,300,000.00 | 4 | 2,000,000.00 |
| 9 | වත්තල | 4 | 2,000,000.00 | 4,235,032.00 | 2,235,032.00 | 4 | 1,993,822.40 |
| 10 | මහර | 6 | 3,000,000.00 | 5,824,992.00 | 2,824,992.00 | 6 | 2,980,468.00 |
| 11 | දොම්පේ | 7 | 3,500,000.00 | 6,087,348.00 | 2,587,348.00 | 7 | 3,495,050.50 |
| 12 | බියගම | 5 | 2,500,000.00 | 4,151,181.00 | 1,651,181.00 | 5 | 2,500,000.00 |
| 13 | කැළණිය | 3 | 1,500,000.00 | 2,242,785.00 | 44,413.05 | 3 | 1,500,000.00 |
| **එකතුව** | | 66 | 33,000,000.00 | 55,897,984.00 | 22,202,539.05 | 66 | 32,791,157.40 |



## 3.13. එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන - 2012

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කොටගෙන ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩසටහන යටතේ 2012 වර්ෂය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

මෙහිදී ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 1177 න් වසම් 1100 ක ව්‍යාපෘති 1102 ක් ක්‍රියාත්මක කරන ලදි. 2012-12-31 වනවිට එම ව්‍යාපෘති 1102 න් ව්‍යාපෘති 1021 ක වැඩ අවසන් කර ව්‍යාපෘති 834 ක් සඳහා රුපියල් මිලියන 781.92 ක මුදලක් ගෙවන ලදි.

**එක් ගමකට එක් වැඩක් සංවර්ධන ව්‍යාපෘති අංශ අනුව වර්ගීකරණය - 2012**

| අනු අංකය | අංශය | ග්‍රා.නි වසම් සංඛ්‍යාව (3) | ව්‍යාපෘති සංඛ්‍යාව(4) | මුළු ඇස්තමේන්තු මුදල රු මි. | මුළු ප්‍රජා දායකත්වය (රු මි) | රජයේ දායකත්වය (රු මි) | ගෙවූ මුළු මුදල (රු මි) |
|---|---|---|---|---|---|---|---|
| 1 | මාර්ග,පාලම්,බෝක්කු | 978 | 980 | 1,003.70 | 50.55 | 941.29 | 722.20 |
| 2 | ජල සම්පාදන | 12 | 12 | 10.84 | 2.87 | 8.75 | 9.92 |
| 3 | සුළු වාරිමාර්ග | 12 | 12 | 13.90 | 2.13 | 11.72 | 9.01 |
| 4 | මාතෘ නිවාස | 4 | 4 | 4.48 | 0.57 | 3.92 | 3.61 |
| 5 | පෙර පාසැල් | 13 | 13 | 15.52 | 2.71 | 12.70 | 10.86 |
| 6 | විදුලිය | 0 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ගොඩනැගිලි | 65 | 65 | 73.84 | 12.04 | 61.42 | 20.99 |
| 8 | ක්‍රීඩා පහසුකම් | 14 | 14 | 15.41 | 2.68 | 13.68 | 4.34 |
| 9 | සෞඛ්‍ය/සනීපාරක්ෂක පහසුකම් | 0 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | වෙනත් | 2 | 2 | 2.48 | 0.43 | 2.05 | 0.98 |
| **එකතුව** | | 1100 | 1102 | 1,140.17 | 73.98 | 1,055.53 | 781.92 |

එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝ මීටර් 258 ක් කොන්ක්‍රීට් කිරීම හා ගල් අතුරා තාර දැමීම සිදු කරන ලදි.

## එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන - 2012 සඳහා මුළු වියදම (රු මි)



# 4. දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය

## සමෘද්ධි වැඩසටහන 2012

| සංවර්ධන ව්‍යාපෘති | | |
|---|---|---|
| **වැඩසටහන** | **ව්‍යාපෘති ගණන** | **මුදල (රු.මි )** |
| ජීවනෝපාය සංවර්ධනය | 983 | 22.98 |
| විශේෂ අන්නාසි වගා ව්‍යාපෘති | 110 | 0.25 |
| බැංකු ගොඩනැගිලි ඉදිකිරීම් | 10 | 4.33 |
| නිවාස වැඩසටහන | 324 | 17.87 |
| **එකතුව** | **1,427** | **45.43** |

| සමාජ ආරක්ෂණ / සිප්දොර ශිෂ්‍යත්ව | | |
|---|---|---|
| **වැඩසටහන** | **ප්‍රතිලාභීන් ගණන** | **මුදල ( රු.මි )** |
| මරණ | 2,044 | 20.44 |
| උපත් | 199 | 0.99 |
| රෝහල් | 1,357 | 3.65 |
| විවාහ | 1,306 | 3.92 |
| **එකතුව** | **4,906** | **29.00** |
| සිප්දොර ශිෂ්‍යත්ව | 6,758 | 5.89 |

| සමෘද්ධි සහනාධාර වැඩසටහන | | |
|---|---|---|
| **වැඩසටහන** | **පවුල් සංඛ්‍යාව** | **මුදල (රු මිලියන )** |
| සමෘද්ධි සහනාධාර | 128,704 | 1,130.12 |
| පෝෂණ වැඩසටහන | 1,969 | 14.92 |

## 4. 1. දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වූ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

දිවිනැගුම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක වූ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආරක්ෂිත ගෘහ සඳහා රු. 80,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ ආරක්ෂිත ගෘහ 129 ක් ඉදිකරන ලදි. ඒ සඳහා වැය කල මුදල රු. මිලියන 9.82 කි.

විසිතුරු මල් වගා ව්‍යාපෘති සඳහා රු. 25,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ විසිතුරු මල් වගා ව්‍යාපෘති 293 ක් සඳහා රෝපණ ද්‍රව්‍ය හා උපකරණ ලබා දෙන ලදි, ඒ සඳහා වැය කල මුදල රු.මි. 7.12 කි.

මී මැසි පාලන ව්‍යාපෘති සඳහා රු. 2,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ 262 කු සඳහා මී මැසි පෙට්ටි ලබා දෙන ලදි. ඒ සඳහා වැය කල මුදල රු. මි. 0.43 කි.

බිම් මල් වගා ව්‍යාපෘති සඳහා රු. 10,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ ව්‍යාපෘති 153 ක් සඳහා රෝපණ ද්‍රව්‍ය හා දැල් ලබා දෙන, ඒ සඳහා වැය කල මුදල රු.මි. 1.48 කි.

ගව ගාල් සදහා රු. 35,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ ගව ගාල් 65 ක් ඉදි කරන ලදි. ඒ සඳහා වැය කල මුදල රු.මි. 2.23 කි.

එළු පාලන ව්‍යාපෘති සඳහා රු. 15,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, මේ යටතේ පුද්ගලයින් 69 දෙනෙකු සඳහා එළුවන් ලබා දෙන ලදි. ඒ සඳහා වැය කල මුදල රු.මි. 0.99 කි.

විසිතුරු මසුන් ඇතිකිරීමේ වැඩසටහන යටතේ රු. 36,000/= ක ප්‍රදානයක් ලබා දෙන ලද අතර, ව්‍යාපෘති 11 ක් සඳහා අවශ්‍ය ටැංකි සහ උපකරණ ලබා දෙන ලදි. ඒ සඳහා වැය කල මුදල රු.මි. 0.37 කි.

තවද, කිතුල් ගස් මැදීමේ ව්‍යාපෘති යටතේ එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල අතර, ඒ සඳහා රු.මි. 0.004 ක් වැය කරන ලදි.

මේ අනුව දිවිනැගුමට සමගාමී ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 983 ක් ක්‍රියාත්මක කල අතර, ඒ සඳහා වැය කල මුළු මුදල රු.මි. 22.98 කි. (ආකෘති පත්‍ර 01 )

## 4. 2. සමාජ සංවර්ධන වැඩසටහන

### දිරිය පියස නිවාස වැඩසටහන

2012 වර්ෂයේදී දිරිය පියස නිවාස වැඩසටහන යටතේ නිවාස 324 ක් ඉදි කරන ලදි. ඒ සඳහා සමෘද්ධි අධිකාරිය යටතේ රු.මි. 2.88 ක් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ රු.මි. 14.98 ක් වැය කරන ලද අතර, මෙම වැඩසටහනට වැය කල මුළු මුදල රු.මි. 17.87 කි. ( ආකෘති අංක 02 හා 03 )

### අධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන

මේ යටතේ විවිධ වැඩසටහන් රාශියක් සිදු කරන ලද අතර, 2012 වර්ෂයේදී වැඩසටහන් 20,534 ක් ක්‍රියාත්මක කරන ලදි.

## 4. 3. සමෘද්ධි බැංකු වැඩසටහන

| සමෘද්ධි බැංකු වැඩසටහන (2012.12.31 දක්වා සමුච්ජිත) | | |
|---|---|---|
| වැඩසටහන | සංඛ්‍යාව | මුදල (රු මිලියන ) |
| තැන්පතු ( සමුච්ජිත ) | 1058062 | 4,610.78 |
| ණය මුදාහැරීම | 489,762 | 11,623.38 |
| ආයෝජන | - | 4,995.79 |

**බැංකු වැඩසටහන**

දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 86 මගින් ප්‍රතිලාභීන්ගේ තැන්පතු ඒකරාශීකරණය හා ණය ලබාදීම සිදු කරන ලද අතර , 2012.12.31 දින වන විට සමෘද්ධි බැංකු සංගම් සතු මුළු තැන්පතු මුදල රු.මි. 4,610.78 වන අතර, නිකුත් කර ඇති මුළු ණය මුදල රු.මි. 11,623.38 කි. 2012 වර්ෂය තුළ සමෘද්ධි බැංකු සංගම් මඟින් රු.මි. 2,790.00 ක් ණය වශයෙන් මුදාහල අතර, නිකුත් කල ණය සංඛ්‍යාව 45384 කි. 2012.12.31 දිනට සමෘද්ධි බැංකු සංගම් මඟින් රාජ්‍ය බැංකු වල ආයෝජනය කල මුදල රු.මි. 4,995.79 කි. තවද, 2012 වර්ෂය තුල සමෘද්ධි බැංකු සංගම් සහ මහා සංගම් උපයා ගත් ලාභය රු.මි. 202.27 කි.

**සමෘද්ධි බැංකු සංගම් ඉදිකිරීම් හා අළුත්වැඩියා**

සමෘද්ධි බැංකු සංගම් 10 ක ඉදිකිරීම් හා අළුත් වැඩියා කටයුතු සඳහා රු.මි. 4.33 ක් වැය කරන ලදි. (ආකෘති පත්‍ර අංක 04)

**සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

මෙම වසරේදී සමෘද්ධි සහනාධාර වැඩසටහන සඳහා රු. මිලියන 1,130.12 ක් ද, සමාජ ආරක්ෂණ කටයුතු සඳහා රු. මිලියන 29.00 ක් වැය කරන ලදි. මීට අමතරව පෝෂණ වැඩසටහන සඳහා රු මිලියන 14.91 ක් වැය කරන ලදී.

( ආකෘති අංක 05 හා 06 සහ 07 )

**කාර්ය මණ්ඩලය**

**සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

| | | |
|---|---|---|
| සමෘද්ධි සහකාර කොමසාරිස්/දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 01 |
| ප්‍රවර්ධන නිලධාරි | - | 01 |
| කළමනාකරණ සහකාර | - | 11 |
| රියදුරු/කාර්යාල කාර්ය සහායක | - | 02 |
| | | 15 |

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

| | | |
|---|---|---|
| සමෘද්ධි සම්බන්ධිකරණ නිලධාරි | - | 01 |
| සමෘද්ධි කළමනාකරු | - | 141 |
| සමෘද්ධි කළමනාකරු (විගණන) | - | 06 |
| අධීක්ෂණ කළමණාකරු | - | 05 |
| විගණන නිලධාරි | - | 02 |
| සමෘද්ධි ලිපිකරු | - | 08 |
| සමෘද්ධි සංවර්ධන නිලධාරි | - | 1,695 |
| රියදුරු | - | 01 |
| කාර්යාල කාර්ය සහායක | - | 01 |
| | | 1,860 |

## <u>දිවි නැගුමට සමගාමී ජීවනෝපාය සංවර්ධන වැඩසටහන</u>
## <u>2012.12.31 දිනට ප්‍රගතිය</u>

**ආකෘති අංක 01**

### දිවි නැගුමට සමගාමී ජීවනෝපාය සංවර්ධන අංශය

| වැඩ විෂය | ක්‍රියාත්මක කල සංඛ්‍යාව | වැය කල මුදල ( රු. ) |
|---|---|---|
| ආරක්ෂිත ගෘහ | 129 | 9,826,762 |
| විසිතුරු මල් වගාව | 293 | 7,120,952 |
| මී මැසි පාලනය | 262 | 433,135 |
| බිම් මල් වගාව | 153 | 1,483,315 |
| ගව ගාල් | 65 | 2,230,200 |
| එළු පාලන | 69 | 994,700 |
| විසිතුරු මසුන් | 11 | 379,880 |
| කිතුල් ගස් මැදීම | 1 | 4,536 |
| පරිපාලන වියදම් | | 511,888.45 |
| **එකතුව** | **983** | **22,985,370.09** |

## <u>දිරිය පියස නිවාස වැඩසටහන - 2012</u>

**ආකෘති අංක 02**

| **වැඩසටහන** | **සංඛ්‍යාව** | **මුදල (රු.)** |
|---|---|---|
| දිරිය පියස නිවාස (රු. 50,000/= ) | 20 | 1,000,000.00 |
| දිරිය පියස රු.මි. දෙකට අදාලව | 33 | 1,888,000.00 |
| **උප එකතුව** | **53** | **2,888,000.00** |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දුන් නිවාස | 271 | 14,982,000.00 |
| **මුළු එකතුව** | **324** | **17,870,000.00** |

**ආකෘති අංක 03**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිරිය පියස නිවාස (රු. 50,000/= ) | | දිරිය පියස රු.මි. දෙකට අදාලව | | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දුන් නිවාස | |
|---|---|---|---|---|---|---|---|
| | | **ඉදි කළ නිවාස සංඛ්‍යාව** | **වැය කළ මුදල රු.** | **ඉදි කළ නිවාස සංඛ්‍යාව** | **වැය කළ මුදල රු.** | **ඉදි කළ නිවාස සංඛ්‍යාව** | **වැය කළ මුදල රු.** |
| 1 | අත්තනගල්ල | 0 | 0 | 4 | 224,000 | 29 | 1,741,500 |
| 2 | බියගම | 1 | 50,000 | 0 | 0 | 18 | 698,000 |
| 3 | දිවුලපිටිය | 6 | 300,000 | 4 | 224,000 | 29 | 1,570,500 |
| 4 | දොම්පේ | 1 | 50,000 | 8 | 448,000 | 37 | 1,552,500 |
| 5 | ගම්පහ | 5 | 250,000 | 5 | 280,000 | 17 | 1,221,500 |
| 6 | ජා-ඇල | 4 | 200,000 | 4 | 244,000 | 11 | 872,500 |
| 7 | කටාන | 0 | 0 | 0 | 0 | 15 | 1,047,000 |
| 8 | කැළණිය | 0 | 0 | 0 | 0 | 7 | 523,500 |
| 9 | මහර | 1 | 50,000 | 2 | 112,000 | 14 | 1,221,500 |
| 10 | මීරිගම | 1 | 50,000 | 2 | 132,000 | 21 | 1,741,500 |
| 11 | මිණුවන්ගොඩ | 1 | 50,000 | 2 | 112,000 | 42 | 1,570,500 |
| 12 | මීගමුව | 0 | 0 | 0 | 0 | 20 | 523,500 |
| 13 | වත්තල | 0 | 0 | 2 | 112,000 | 11 | 698,000 |
| **එකතුව** | | **20** | **1,000,000** | 33 | **1,888,000** | **271** | **14,982,000** |

## බැංකු ගොඩනැගිලි ඉදිකිරීම් - 2012

ආකෘති අංක 04

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ක්‍රියාත්මක කල ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කල මුදල රු. | වැය කල මුදල |
|---|---|---|---|---|
| 1 | මිගමුව | 01 | 200,000.00 | 200,000.00 |
| 2 | මහර | 02 | 800,000.00 | 796,601.70 |
| 3 | මීරිගම | 02 | 950,000.00 | 904,157.84 |
| 4 | මිනුවන්ගොඩ | 02 | 833,350.00 | 833,350.00 |
| 5 | ගම්පහ | 01 | 530,000.00 | 530,000.00 |
| 6 | දිවුලපිටිය | 02 | 383,432.00 | 383,432.00 |
| 7 | අත්තනගල්ල | 01 | 700,000.00 | 692,258.40 |
| **එකතුව** | | **10** | **4,396,782.00** | **4,339,799.94** |

## පෝෂණ වැඩසටහන - 2012

ආකෘති අංක 05

| ප්‍රා/ලේ කොට්ඨාශය | සංඛ්‍යාව | මුදල (රු.මි.) |
|---|---|---|
| අත්තනගල්ල | 248 | 3.45 |
| බියගම | 8 | 0.10 |
| දිවුලපිටිය | 221 | 1.52 |
| දොම්පේ | 154 | 1.21 |
| ගම්පහ | 110 | 0.63 |
| ජා-ඇල | 59 | 0.52 |
| කටාන | 40 | 0.39 |
| කැළණිය | 57 | 0.33 |
| මහර | 160 | 1.09 |
| මීරිගම | 377 | 3.15 |
| මිණුවන්ගොඩ | 430 | 1.49 |
| මීගමුව | 35 | 0.54 |
| වත්තල | 70 | 0.43 |
| **එකතුව** | **1,969** | **14.91** |

## 2012 වර්ෂය සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

**ගම්පහ දිස්ත්‍රික්කය** **ආකෘති පත්‍ර - 06**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මරණ | | උපත් | | රෝහල් | | විවාහ | | එකතුව | | සිප්දොර ශිෂ්‍යත්ව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගෙවන ලද ප්‍රතිලා සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ගෙවන ලද ප්‍රතිලාභ සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. | ලබා දෙන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ගෙවන ලද මුදල රු. |
| 1 | අත්තනගල්ල | 212 | 2120000 | 27 | 135000 | 159 | 396000 | 186 | 558000 | 584 | 3209000 | 407 | 329500 |
| 2 | බියගම | 128 | 1280000 | 14 | 70000 | 64 | 209200 | 71 | 213000 | 277 | 1772200 | 625 | 535500 |
| 3 | දිවුලපිටිය | 293 | 2930000 | 35 | 175000 | 241 | 609000 | 250 | 750000 | 819 | 4464000 | 582 | 515000 |
| 4 | දොම්පේ | 160 | 1600000 | 5 | 25000 | 77 | 250000 | 51 | 153000 | 293 | 1778000 | 630 | 602000 |
| 5 | ගම්පහ | 152 | 1520000 | 19 | 95000 | 96 | 286900 | 91 | 273000 | 358 | 2174900 | 562 | 540000 |
| 6 | ජා ඇල | 132 | 1320000 | 13 | 65000 | 99 | 309900 | 87 | 261000 | 331 | 1955900 | 430 | 338000 |
| 7 | කටාන | 122 | 1220000 | 7 | 35000 | 41 | 149700 | 35 | 105000 | 205 | 1509700 | 457 | 386000 |
| 8 | කැළණිය | 70 | 700000 | 10 | 50000 | 36 | 99200 | 36 | 108000 | 152 | 957200 | 390 | 285500 |
| 9 | මහර | 148 | 1480000 | 26 | 130000 | 90 | 273300 | 97 | 291000 | 361 | 2174300 | 497 | 434000 |
| 10 | මීරිගම | 257 | 2570000 | 14 | 70000 | 271 | 763500 | 188 | 564000 | 730 | 3967500 | 632 | 554500 |
| 11 | මිනුවන්ගොඩ | 187 | 1870000 | 14 | 70000 | 92 | 282100 | 114 | 342000 | 407 | 2564100 | 518 | 454500 |
| 12 | මිගමුව | 79 | 790000 | 5 | 25000 | 30 | 94200 | 29 | 87000 | 143 | 996200 | 335 | 310000 |
| 13 | වත්තල | 104 | 1040000 | 10 | 50000 | 61 | 177800 | 71 | 213000 | 246 | 1480800 | 693 | 611000 |
| **එකතුව** | | **2044** | **2044000** | **199** | **995000** | **1357** | **3650800** | **1306** | **3918000** | **4906** | **29003800** | **6758** | **5895500** |

## 2012 වර්ෂය සඳහා සමෘද්ධි සහනාධාර බෙදාදීම

ආකෘති පත්‍ර - 07

| 1අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සහනාධාර වර්ගීකරණය | | | | | මාසික මුදල රු. | සහනාධාර වාරය සඳහා ගෙවන ලද මුළු මුදල (රු) | දිස්ත්‍රික්කයේ මුළු පවුල් ගණන | සහනාධාර ලබන පවුල් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **1500/=** | **1200/=** | **750/=** | **210/=** | එකතුව | | | | |
| **1** | අත්තනගල්ල | 62 | 0 | 9636 | 837 | 10535 | 7,495,770 | 89,949,240 | 38,923 | 27% |
| **2** | බියගම | 0 | 0 | 6700 | 170 | 6870 | 6,060,700 | 60,728,400 | 40,514 | 17% |
| **3** | දිවුලපිටිය | 39 | 0 | 13596 | 2001 | 15636 | 10,675,710 | 128,108,520 | 33,454 | 47% |
| **4** | දොම්පේ | 19 | 4301 | 3122 | 531 | 7973 | 7,642,710 | 91,712,520 | 33,770 | 24% |
| **5** | ගම්පහ | 63 | 0 | 7457 | 259 | 7779 | 5,741,640 | 68,899,680 | 44,008 | 18% |
| **6** | ජා ඇල | 61 | 0 | 9991 | 96 | 10148 | 7,604,910 | 91,258,920 | 46,382 | 22% |
| **7** | කටාන | 17 | 0 | 10412 | 475 | 10904 | 7,934,250 | 95,211,000 | 61,819 | 18% |
| **8** | කැළණිය | 3 | 0 | 7359 | 113 | 7475 | 5,547,480 | 66,569,760 | 32,963 | 23% |
| **9** | මහර | 18 | 0 | 10182 | 360 | 10560 | 7,739,100 | 92,869,200 | 44,424 | 24% |
| **10** | මීරිගම | 10 | 0 | 10659 | 1956 | 12625 | 8,420,010 | 101,040,120 | 39,022 | 32% |
| **11** | මිනුවන්ගොඩ | 27 | 0 | 9953 | 743 | 10723 | 7,661,280 | 91,935,360 | 37,888 | 28% |
| **12** | මීගමුව | 3 | 0 | 9549 | 191 | 9743 | 7,206,360 | 86,476,320 | 34,590 | 28% |
| **13** | වත්තල | 1 | 0 | 7078 | 654 | 7733 | 5,447,340 | 65,368,080 | 39,284 | 20% |
| එකතුව | | **323** | **4301** | **115694** | **8386** | **128704** | **94,177,260** | **1,130,127,120** | **527,041** | **24 %** |

* රු. 1200/= සහනාධාර නිකුත් කරනු ලබන්නේ දොම්පෙ කොට්ඨාශය සඳහා පමණි.

# 05. සංස්කෘතික අංශය

ගම්පහ දිස්ත්‍රික්කයේ වාර්ෂිකව පවත්වනු ලබන ඓතිහාසික , සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා සංවිධානය. මේ යටතේ පහත සඳහන් සංස්කෘතික කටයුතු සඳහා දායක වීම

**පෙරහැර සංවිධානය**

- කැලණිය රජමහා විහාරස්ථ වාර්ෂික දුරුතු මහා පෙරහැර 2013.01.25 දින උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ අතර, මෙම පෙරහැර පැවැත්වීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සැපයීමට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

- ඉඳිගොල්ල, ශාන්ත ජුඩ් දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය 2012.10.27 හා 28 දිනවල පැවැත්වූ අතර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

**අන්තර් කලායතන තරගාවලිය**

කලායතන 26 සඳහා 2012.07.15 වන දින ගම්පහ, තක්ෂිලා විද්‍යාලයේදී මෙම තරග සංවිධානය කරන ලදී.

**රාජ්‍ය නර්ථන උළෙල දිස්ත්‍රික් තරඟ සංවිධානය**

රාජ්‍ය නර්ථන උළෙලේ ජාතික මට්ටම සඳහා ඉදිරිපත් කළ යුතු දිස්ත්‍රික් ජයග්‍රාහකයන් තේරීම සඳහා මෙම තරඟාවලිය සංවිධානය කරන ලදී.

උඩරට , පහතරට, සරබරගමු නර්ථන සම්ප්‍රදායන් සඳහා වයස් කාණ්ඩ කිහිපයක් යටතේ කණ්ඩායම් 37කින් දිස්ත්‍රික්කයේ සුදුස්සන් තෝරා ගැනීම. මෙම තරඟය 2011.11.10 දින ගම්පහ තක්ෂිලා විද්‍යාලයේ පවත්වන ලදී.

මෙම තරඟාවලියේදී ජයග්‍රාහකයන් තෝරා, ජාතික තරඟාවලිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**රාජ්‍ය ළමා චිත්‍ර උළෙල - 2012 ( දිස්ත්‍රික් තරඟාවලිය)**

රාජ්‍ය ළමා චිත්‍ර උළෙලේ දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලැබූ ගම්පහ දිස්ත්‍රික් ළමා චිත්‍ර තරඟාවලිය 2012.08.29 දින ගම්පහ, ඉඳිගොල්ල පිරිවෙනේදී පැවැත්විණි.

**ජාතික සාහිත්‍ය තරඟාවලිය හා ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය**

ප්‍රාදේශීය මට්ටමින් ජයග්‍රහණය කළ සාහිත්‍ය නිර්මාණ දිස්ත්‍රික් තරඟ සඳහා ඉදිරිපත් කිරීම හා ඉන් ජයග්‍රහණය කළ නිර්මාණ ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම.

දිස්ත්‍රික් තරඟාවලිය සිංහල,දෙමළ,හා ඉංග්‍රීසි යන අංශ තුනෙන්ම පවත්වන ලදී.තරඟ ඉසව් 38 සඳහා ස්ථාන 90 ක් තෝරා ගන්නා ලදී.

2012 - රාජ්‍ය සාහිතය කලා මහෝත්සවය 2012 සැප්තැම්බර් මස 28,29,30 තෙදින පුරා ගම්පහ, පත්තලගෙදර සියනෑ විද්‍යා පීඨයේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.ඉහත දිස්ත්‍රික් ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග හා සහතික ප්‍රදානය මුල්කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික් සාහිත්‍ය කලා මහෝත්සවය 2012.09.29 දින හාපිටිගම විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ විශේෂ සාහිත්‍ය දේශනයක් සමගින් අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

## සංස්කෘතික බල මණ්ඩල ප්‍රතිසංවිධානය

- දිස්ත්‍රික් සංස්කෘතික බල මණ්ඩලය පිහිටුවන ලදී.

උක්ත වැඩසටහන යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- බොදු බැති ගී සමාධිය ( තරගය )

මෙම වැඩසටහන යටතේ අත්තනගල්ල, මීරිගම, මිනුවන්ගොඩ,බියගම,මහර,දොම්පෙ සහ ගම්පහ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර බැති ගී තරගාවලියක් පැවැත්විණ.එහි ජයග්‍රාහක කණ්ඩායම් සඳහා සහතික පත් ප්‍රදානය කරන ලදී.

- සදෙස සංස්කෘතික සඟරාව අලෙවිය

මෙම වැඩසටහන යටතේ ලබාදුන් සඟරා 20ක ප්‍රමාණය අලෙවි කරන ලදී.

- ගම්පහ ත්‍රී රෝද රථ රියදුරන් වෙනුවෙන් ගීත රස වින්දන වැඩසටහනක්

සංගීතවේදී සුදත් සමරසිංහ මහත්මාගේ ගී රස වින්දනය ආශ්‍රයෙන් ඔවුන් හට භාවමය පණිවිඩයක් ලබාදීම සහ ගම්පහ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තුමන්ගේ ප්‍රධානත්වයෙන් "අනතුරු,මාර්ත නීති,අපචාර හා ත්‍රී රෝද රථ රියදුරා" යන මැයෙන් නීතිමය දැනුවත් කිරීමක් කිරීමක් සිදු කරන ලදී.

මේ සඳහා දිස්තික් සංස්කෘතික බල මණ්ඩයේ සමාජිකයට අමතරව ත්‍රී රෝද රථ රියදුරන් 300කට ආසන්න ප්‍රමාණයක් සහභාගි විය.

- සංස්කෘතික බල මණ්ඩයේ සමාජිකයන් සඳහා ගී රස විචාරය සාකච්ඡාමය වැඩසටහන

කැලණිය විශ්ව විද්යාලයේ කථිකාචාර්ය මහාචාර්ය සුසන්ත මහලුල්පත මහතාගේ දේශකත්වයෙන් යුතුව 2012.12.14 දින ගම්පහ නන්දන මාවතේ ප්‍රජා ශාලාවේදී පවත්වන ලදී.

- **සැපතකි මේ දරු පොත් බෙදා දීමේ වැඩසටහන**

අත්තනගල්ල රජ මහා විහාරාධිපති පන්නිල ආනන්ද ස්වාමීන් වහන්සේගේ විශේෂ ධර්ම දේශනාවක් සමගින් ගම්පහ දිස්ත්‍රික් ළමා ළමාජයේ දරු දැරියන් සඳහා උපදේශාත්මක කවි එකතුවකින් යුතු මෙම පොත් බෙදා දෙන ලදී.

## ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ගම්පහ දිස්ත්‍රික් ලේඛක සංගමය හා එක්ව 2012 වර්ෂයේ විශේෂ වැඩසටහන් රාශියක් සංවිධානය කරන ලදී.

- නව නිලධාරි මණ්ඩලය පත්කිරීම
- ප්‍රවීන ගීත රචක යමුනා මාලනී මහත්මියගේ විශේෂ දේශනයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සංවිධානය කරන ලදී
- සිංහල කවියේ රිද්මය යන මැයෙන් ප්‍රවීන ලේඛක ප්‍රභාත් විජේසිංහ මහතාගේ විශේෂ වැඩසටහනක් පවත්වන ලදී
- සරත් වීරසිංහ මහතාගේ "නෙළුම් මල් කෘතිය පිළිබඳ විචාරත්මක වැඩසටහනක් එච් පී නන්දසාර මහතා විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.
- රැපියෙල් තෙන්නකෝන් මහතාගේ ගුණ සැමරුම
- ගම්පහ දිස්ත්‍රික් ලේඛකයන් සඳහා වූ සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය - 2012

## නව කලායතන ලියාපදිංචි කිරීම

2012 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික්කය තුළ නව කලායතන 08 ක් ලියාපදිංචි කරන ලදී.

| කලායතනයේ නම | ලියාපදිංචි අංකය | ප්‍රා.ලේ.කොට්ඨාශය |
|---|---|---|
| ශ්‍රී සංගිත් භවන් සංගීත කලායතනය | ගම් 198 | අත්තනගල්ල |
| රංගාවී කලායතනය | ගම් 195 | මහර |
| ගීනෙත් කලායතනය | ගම් 197 | ජා-ඇල |
| අමෝධ්‍යා කලායතනය | ගම් 196 | මීරිගම |
| ගීතමංජරි කලායතනය | ගම් 194 | වත්තල |
| නේත්‍රා රංග ශිල්ප කලායතනය | ගම් 193 | මිනුවන්ගොඩ |
| දිල්කුෂි කලායතනය | ගම් 192 | දිවුලපිටිය |
| සුමේධා භාරත කලායතනය | ගම් 191 | මහර |

# 06. බෞද්ධ කටයුතු අංශය

සම්බන්ධීකරණය

- බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

දහම් පාසල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා සිදුකරන ලද කාර්යයන්

දහම් පාසල් පෙල පොත් හා අනෙකුත් පොත් බෙදා දීම.

2012 වර්ෂයේ දහම් පාසල් පෙල පොත් සහ අනෙකුත් අවශ්‍ය පොත්පත් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දහම් පාසල් 713 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 222,775 කට හා ගුරුවරුන් වෙත බෙදා දීම සඳහා දළ වශයෙන් රුපියල් 9,563,690.00 ක (රුපියල් අනූපන් ලක්ෂ හැටතුන්දහස් හයසිය අනුවක පමණ) මුදලක් වැය කර ඇත.

<u>දහම් පාසල් ගුරුභවතුන් වෙනුවෙන් පුස්තකාල දීමනා ලබා දීම.</u>

අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සියලුම දහම් පාසල් ගුරු භවතුන් වෙනුවෙන්ම එක් ගුරුභවතෙකුට වර්ෂයකට රු. 2000.00 බැගින් වූ පුස්තකාල දීමනාවක් ලබාදීම. ඒ අනුව 2012 වර්ෂයේ දී දහම් පාසල් ගුරුභවතුන් 8644 ක් වෙනුවෙන් රු.17,288,00.00 ක මුදලක් බෙදා දෙන ලදී.

<u>දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.</u>

දහම් පාසල් 6 - 10 ශ්‍රේණි සඳහා වර්ෂාවසාන විභාග පැවැත්වීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් දීප ව්‍යාප්තව සිදු කරනු ලබන අතර, විභාගයෙන් සමත් වන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙතම සහතික පත්‍රයක් නිකුත් කිරීම ද සිදු කරනු ලබයි.

| වර්ෂය | මධ්‍යස්ථාන ගණන | සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම් වූ මුදල |
|---|---|---|---|
| 2012 | 496 | 90852 | රු. 908520.00 |

දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන.

මෙවර ද ප්‍රාදේශීය මණ්ඩල ඇගයීම් සිදු කර දිස්ත්‍රික් සිසු නිපුණතා ඇගයීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව සමස්ත ලංකා ඇගයීම් සඳහා සිසුන් ඉදිරිපත් කරන ලදී. මෙවර සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන දෙසම්බර් මස 28, 29 සහ 30 යන දිනවල පැවතියේ පුත්තලම දිස්ත්‍රික්කයේ මාදම්පෙ සේනානායක විද්‍යාලයයේදී ය. මෙම වැඩසටහන සඳහා දීපව්‍යාප්තව දහම් පාසල් සිසු දරු දැරියන් වෙනුවෙන් සිදු කරන දැවැන්ත වැඩසටහන් මාලාවකි.

| ප්‍රථම ස්ථානය | දෙවන ස්ථානය | තෙවන ස්ථානය | සිවුවන ස්ථානය | පස්වන ස්ථානය |
|---|---|---|---|---|
| 4 | 7 | 5 | 1 | 1 |

1 සිට 5 දක්වා ජයග්‍රහන 18 ක් ලබාගනිමින් දිස්ත්‍රික්ක 21 ක් අතුරින් ගම්පහ දිස්ත්‍රික්කය ප්‍රථම ස්ථානය ලබා ගන්නා ලදී.

දහම් සරසවිය වැඩසටහන

දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම වඩාත් වර්ධනය කර ගැනීමටත් එය තුළින් ඔවුන්ට උසස් අධ්‍යාපනය සඳහා දොරටු විවෘත කර දීමත් අරමුණු කොටගෙන පවත්වන වැඩසටහනකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය හා පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයය සමග ඒකාබද්ධව මෙම වැඩසටහන පවත්වනු ලබයි.

| මධ්‍යස්ථානය | ශිෂ්‍ය සංඛ්‍යාව | අනුබද්ධ විශ්ව විද්‍යාලයය |
|---|---|---|
| ගම්පහ සාම මහ විහාරය<br>මිනුවන්ගොඩ රාජමහා විහාරය | 78<br>80 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය |

පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව

දහම් පාසල් ගුරු භවතුන් ගේ පාලි භාෂා ඥානය වැඩිදියුණු කිරීම උදෙසා මෙම 2012 වර්ෂයේ දී ද පාලි භාෂා ප්‍රවර්ධන පාඨමාලාව දිස්ත්‍රික්කයේ තෝරාගත් මධ්‍යස්ථානයක දී පවත්වා අදාළ පරීක්ෂණ ද පවත්වා නිම කරන ලද අතර, මෙම පාඨමාලාව සඳහා රු. 75,400.00 ක පමණ මුදලක් බෞද්ධ කටයුතු දෙපාර්මේන්තුව මගින් වැය කර තිබුණි.

සිදු කරන ලද වෙනත් කාර්යයන්

විශේෂ ආගමික උත්සව, පෙරහැර හා සංස්කෘතික වැඩසටහන්, සංස්කෘතික අංශය හා එක්ව පැවැත්වීම.
දහම් පාසල් සිසුන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ත්‍යාග සහ සහතික පත්‍ර බෙදාදීමේ උත්සවය සංවිධානය හා පැවැත්වීම.

කපිලවස්තුපුර සර්වඥ ධාතු ප්‍රදර්ශනය

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ ඉල්ලීමකට අනුව ඉන්දියාවේ නවදිල්ලි නුවර ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කපිලවස්තුපුරයෙන් සොයාගන්නා ලද සර්වඥධාතුන් වහන්සේලා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් 2012 අගෝස්තු මස 19 වන ශ්‍රී ලංකාවට වැඩම වූ අතර, එහිසිට විශේෂ රිය පෙරහරකින් කැලණිය බියගම මානෙල්වත්ත මහා විහාරස්ථානය වෙත වැඩම වූ අතර, 22 වන දින උදෑසන දක්වා පැය 24 පුරාම බැතිමතුන් ගේ පූජෝපහාරයන් සඳහා අවකාශ සළසා දුනි. මෙහි දී දිවයිනේ නන් දෙසින් පැමිණි ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසක් අව්වැසි නොතකා සර්වඥධාතූන්වහන්සේලා වන්දනා කිරීම සඳහා සහභාගි වූහ. අතිගරු ජනාධිපතිතුමා ගේ විශේෂ ඉල්ලීමක් පරිදි සර්වඥධාතූන්වහන්සේලා නැවත වතාවක් ඓතිහාසික කැලණිය රාජමහා විහාරස්ථාන පුදබිම වෙත සැප්තැම්බර් මස 11 දින වැඩමවනු ලැබීය. පසුදින උදෑසන ඉන්දියාව වෙත නැවත වඩමවනු ලැබූ සර්වඥධාතූන්වහන්සේලා ප්‍රථමයෙන් හා අවසාන වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ප්‍රදර්ශනය කිරීම විශේෂ සිදුවීමක් විය. මෙම කටයුතු සියල්ල සංවිධානය ජනාධිපති ලේකම් කාර්යාලය, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය හා එක්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයේ මූලිකත්වයෙන් සිදු කරනු ලැබීය.

බෝධිපූජා, සතිපිරිත් දේශනා හා දානමය වැඩසටහන

අතිගරු ජනාධිපතිතුමාට, රජයට, රටට, ජනතාවට, ආරක්ෂක අංශවලට ආශිර්වාද පතා දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන ජනාධිපති කාර්යාලය, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් 2012.11.12 සිට 2012.11.19 දින දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය කර තිබුණි. ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වන වැඩසටහන ඉඳිගොල්ල විද්‍යාවංශ පිරිවෙන් මහා විහාරස්ථානයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයේ සංවිධානයෙන් හා මෙහෙයවීමෙන් ඉතා සාර්ථක අන්දමින් පවත්වා නිම කරන ලදී. එම සතිය තුළ දිනපතා බෝධිපූජාමය පිංකමක් පැවැත්වීම, ස්වාමීන්වහන්සේලා 30 නමකට හීල් දානය හා ස්වාමීන්වහන්සේලා 40 නමකට දහවල් දානය හා පිරිකර පිරිනැමීමත් 18 දින දේවදූත පෙරහර සහ දොරකඩඅස්න දේශනාවත් පවත්වා පසුදින දහවල් 100 නමක් විෂයෙහි අෂ්ඨපරිෂ්කාර සහිත සංඝගතදක්ෂිණාවක් පවත්වා අවසන් කළේ ය. මේ සඳහා දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටි රජයේ ආයතන සම්බන්ධ කරගනු ලැබී ය. සමස්ත වැඩසටහන සඳහා ජනාධිපති කාර්යාලය මගින් සම්බන්ධ කර තිබූ විවිධ ආයතන මගින් මූල්‍යමය හා ද්‍රව්‍යමය අනුග්‍රහය දැක්වීමට කටයුතු කළේ ය.

බෞද්ධ තොරතුරු රැස්කිරීම.

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී විහාරස්ථාන හා දසසිල් මාතා ආරාම සංඛ්‍යාවන් හා ඒවාහි වැඩවසන භික්ෂූන්වහන්සේලා, දසසිල් මාතාවන් සංඛ්‍යාවන් ද, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දහම් පාසල් හා ඒවායේ සේවය කරනු ලබන ගුරු භවතුන්, ශිෂ්‍ය සංඛ්‍යාවන් ද දිස්ත්‍රික්කය තුළ ක්‍රියාකාරී බෞද්ධ සමිති, විහාරස්ථාන කාර්ය සාධක සමිති, විහාර කාර්ය සාධක සමිති, දායක සභා, කුලඟන සමිති ආදී සමිති සමාගම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු රැස්කිරීමේ හා එම තොරතුරු අවශ්‍ය අය වෙත නිකුත් කිරීම ද සිදු කෙරේ.

තායිලන්ත ලෝක සාම ආචාර ධර්ම තරගය

තායිලන්තයේ ධම්මකාය පදනම මගින් ලෝකයේ ථෙරවාද බෞද්ධ රටවල් මුල්කරගෙන ලෝක සාම ආචාර ධර්ම තරග විභාගය පවත්වනු ලබයි. මෙම තරග විභාගය සඳහා සිසු දරු දැරියන් සමග ඔවුන් ගේ දෙමව්පියන්ට ද පවුලක් වශයෙන් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට හා පිළිතුරු ලිවීමට හැකිවීම මෙම විභාගයේ ඇති විශේෂත්වයයි. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ද සිසු දරු දැරියන් ද මෙම තරග විභාගය සඳහා ඉදිරිපත් විය.

දහම් පාසල් ගුරුවරුන් සඳහා වෛද්‍යාධාර ලබාදීම.

දහම් පාසල් ගුරු භවතුන්ගේත් දහම් පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේත් සුභසාධනය උදෙසාත් විහාරස්ථාන සංවර්ධනය කිරීම ඇතුලු අරමුණු මුල් කරගෙන 2008 වසරේ පිහිටුවන ලද සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල මගින් ඉහත වෛද්‍යාධාර ලබාදීම සිදුකෙරේ. ඒ අනුව 2012 වසරේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක දහම් පාසල් ගුරු භවතුන් 15 දෙනෙකුගේ විවිධ සැත්කම් සඳහා වෛද්‍යාධාර වශයෙන් රු. 600,000.00 (රුපියල් හයලක්ෂය) ක මුදලක් ලබාදීමට හැකිවිය. මෙම අරමුදලට මුදල් රැස්කිරීම වසරක් පාසා සිදු කරනු ලබන දහම් පාසල් කොඩි අලෙවිය මගින් සිදු කරනු ලබයි.

විහාරස්ථාන ආධාර ලබාදීම.

විහාරස්ථාන සඳහා සංවර්ධන ආධාර විවිධ විෂයයන් යටතේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදීම සිදු කරනු ලබයි.

ඒ අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන සඳහා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය මගින් රු. 725,000.00(රුපියල් හත්ලක්ෂ විසිපන්දහස)ක් ද, 2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් දහම් පාසල් 2600 ක් සංවර්ධනය කිරීම යටතේ රු. 350,000.00(රුපියල් තුන්ලක්ෂ පනස් දහස) ක මුදලක් ද ලබා දී ඇත.

